සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணத் கல்வித் திணைக்கள
Department of Education – Southern Province

21 | S | I

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021
General Certificate of Education (Advanced Level) Examination - 2021

තෙවන වාර පරීක්ෂණය - 2021 දෙසැම්බර්
Third Term Test – 2021 December

13 ශ්‍රේණිය
Grade 13

ආර්ථික විද්‍යාව - I
Economic – I

පැය දෙකයි
02 hours

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයෙහි ඔබේ **විභාග අංකය** පමණක් ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1),(2),(3),(4),(5) යන පිළිතුරු වලින් **වඩාත් ගැළපෙන පිළිතුර** තෝරා, එය පිළිතුරු පත්‍රයේ කතිරයක් (X) යොදා සලකුණු කරන්න.

01. පහත සඳහන් ප්‍රකාශ අතුරින් අභිමතානුරූපී ප්‍රකාශය තෝරන්න.

1. ආවස්ථික පිරිවැය තීරණය වීම කෙරෙහි සම්පත්වල පවතින හිඟකම සහ හිඟ සම්පත්වල විකල්ප ප්‍රයෝජන පැවතීම යන කරුණු දෙකම බලපානු ඇත.
2. නිෂ්පාදන කාර්යක්ෂමතාවය අත්කර ගැනීමේ දී පූර්ණ සේවා නියුක්තිය හා පූර්ණ නිෂ්පාදනය යන කොන්දේසි දෙකම සම්පූර්ණ වේ.
3. ආර්ථික සම්පත් භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය සහ ව්‍යවසායකත්වය වශයෙන් වර්ග කෙරෙයි.
4. ආදායම ඉහළ යන විට බාල භාණ්ඩ සඳහා ඇති ඉල්ලුම අඩු වේ.
5. 2021 රාජ්‍ය අයවැය මඟින් සෞඛ්‍ය ක්ෂේත්‍රයට වැඩියෙන් මුදල් වෙන්කළ යුතුය.

02. ආර්ථික සම්පත් හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකඟවිය හැකි ප්‍රකාශය කුමක්ද?

1. නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගත හැකි ස්වාභාවිකව ලැබී ඇති වගා කළ හැකි ඉඩම් ප්‍රාග්ධන සම්පත් වේ.
2. තේ, රබර්, කුරුඳු සහ පොල්වතු වැනි වගා කරන ලද ඉඩම් භූමි සම්පතෙහි කොටසකි.
3. ශ්‍රමයේ ඵලදායීතාවය සහ තාක්ෂණික දැනුම ඉහළ නැංවීම සඳහා අධ්‍යාපනය සහ පුහුණු කිරීම් තුළින් නිපුණත්වයට පත් කරන ලද ශ්‍රමය සමාජ ප්‍රාග්ධනය වේ.
4. භාණ්ඩ සහ සේවා නිෂ්පාදනය සහ හුවමාරුව පහසු කෙරෙන විවිධ පොදු සේවා ආර්ථික පොදුකාර්ය ප්‍රාග්ධනය ලෙස සැලකෙනු ඇත.
5. ව්‍යාපාරික අක්‍රමිකතා අලෙවි කටයුතු, මූල්‍ය කටයුතු සහ පිරිස් යනාදී විවිධ ක්ෂේත්‍රයන් මෙහෙය වීම ව්‍යවසායකත්වය ලෙස නිර්වචනය කෙරෙයි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

03. ආවස්ථික පිරිවැය සංකල්පය සහ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයක දී වක්‍රය දිගේ පහළට ගමන් කරන විට සිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයේ නිෂ්පාදනය සමාන ඒකක ප්‍රමාණය බැගින් අඩු කරන විට තිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයෙන් අළුතින් බිහිවන ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවේ.
2. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ඉහළ සිට පහළට ගමන් කරන විට සිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයේ ආවස්ථික පිරිවැය දැක් වේ.
3. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මූලයට අවතල හැඩයක් ගනී නම් වක්‍රය දිගේ පහළට ගමන් කරන විට සිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයේ නිෂ්පාදනය සමාන ලෙස වැඩි කරන විට තිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයෙන් කැපකරන (අත්හරින) ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වේ.
4. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත ඉහළට ගමන් කරන විට තිරස් අක්ෂයේ දැක්වෙන භාණ්ඩයේ ආවස්ථික පිරිවැය ඉදිරිපත් වේ.
5. වැඩෙන ආවස්ථික පිරිවැය තත්ත්වයක දී භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට වඩාත් යෝග්‍ය නිෂ්පාදන සාධකයක් වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේලා එලෙසම යෝග්‍යවනු ඇත.

04. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය විතැන් වීමට බලනොපාන සිදුවීම කුමක්ද?

1. ආර්ථිකයක් ආර්ථික අවපාතයකට මුහුණ දීම.
2. ආර්ථික බිඳවැටීමකට ආර්ථිකයක් මුහුණ දීම.
3. ආර්ථිකයක් යුධ ගැටුම් වලට මුහුණ දීම.
4. ආර්ථික පසු බැසීමකට ආර්ථිකයක් මුහුණ දීම.
5. ආර්ථිකයක වැඩ කළ හැකි වයසේ ජනගහනයේ ඉහළ යාමක් සිදු වීම.

05. X භාණ්ඩයේ ආදායම් ඉල්ලුම් නම්‍යතාවය සෘණ අගයක් ගනු ලබයි. වඩාත්ම නිවැරදි සංයෝජනය පහත සඳහන් ඒවා අතුරින් කවරක් වේද?

මිල වෙනස් වීම	ආදේශන ප්‍රතිවිපාකය යටතේ ඉල්ලුම් ප්‍රමාණය	ආදායම් ප්‍රතිවිපාකය යටතේ ඉල්ලුම් ප්‍රමාණය	මිල ප්‍රතිවිපාකය යටතේ ඉල්ලුම් ප්‍රමාණය
1. වැඩි වෙයි	අඩු වෙයි	අඩු වෙයි	අඩු වෙයි
2. අඩු වෙයි	අඩු වෙයි	අඩු වෙයි	අඩු වෙයි
3. අඩු වෙයි	වැඩි වෙයි	වැඩි වෙයි	වැඩි වෙයි
4. වැඩි වෙයි	අඩු වෙයි	අඩු වෙයි	වැඩි වෙයි
5. වැඩි වෙයි	අඩු වෙයි	වැඩි වෙයි	අඩු වෙයි

06. එක්තරා භාණ්ඩයක් සඳහා අදාළ ඉල්ලුම් සමීකරණය පහත පරිදි වෙයි.

$Qd = 100 - 2p$ වෙයි. එම සමීකරණය $Qd = 50 - 2p$ ලෙසට වෙනස් වී නම් ඒ සඳහා බලපෑ හැකි සාධකය කුමක්ද?

1. භාණ්ඩයට අදාළ පාරිභෝගිකයින්ගේ ආදායම් වැඩි වීම.
2. භාණ්ඩයට අදාළ අනුපූරක භාණ්ඩයක මිල වැඩි වීම.
3. භාණ්ඩයට අදාළ ආදේශන භාණ්ඩයක මිල වැඩි වීම.
4. අදාළ භාණ්ඩයේ අනාගත මිල වැඩි වේ යැයි පාරිභෝගිකයින් අපේක්ෂා කිරීම.
5. අදාළ භාණ්ඩයේ මිල අඩු වීම.

07. පහතින් දැක්වෙන්නේ සිරස් අක්ෂයේ මිල දැක්වෙන කිසියම් භාණ්ඩයකට අදාළ සැපයුම් සමීකරණයන්ය. ඒ අතුරින් වඩාත්ම එකට අඩු සැපයුම් නම්‍යතාවයක් දැක්වෙන සමීකරණය ජවෙනුයේ,

1. $Qs = 0 + 5p$
2. $Qs = 150 + 10p$
3. $Qs = 0 - 5p$
4. $Qs = 10 + 5p$
5. $Qs = -100 + 10p$

08. $Qd = 100 - 10p$ නම් පහත ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
SFD exam2021

1. මිල රුපියල් එකකින් වෙනස්වන විට ඉල්ලුම් ප්‍රමාණය 10 කින් වෙනස්වන අතර මිල ශුන්‍යයේ දී ඉල්ලුම් ප්‍රමාණය 200 ක් වේ.
2. මිල රුපියල් 10 දී ඉල්ලුමේ ලක්ෂ්‍ය නම්‍යතාවය ශුන්‍ය වන අතර ඉල්ලුම් වක්‍රයේ මධ්‍ය ලක්ෂයට අදාළ මිල රුපියල් පහක් වේ.
3. මිල රුපියල් 10 දී ඉල්ලුම් නම්‍යතාවය අපිරිමිත වන අතර මිල රුපියල් 5 දී ඉල්ලුම් නම්‍යතාවය 1.5 ක් වේ.
4. මෙම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ශුන්‍ය වේ නම් මිල ද ශුන්‍ය වේ.
5. මෙම භාණ්ඩයේ ඉල්ලුම් නම්‍යතාවය ඒකීය වනුයේ මිල රුපියල් 5 කදී වන අතර සෑම මිලකදීම ඉල්ලුම ඒකක 20 බැගින් වැඩිවී නම් මිල ඉල්ලුම් නම්‍යතාවය එකට සමානවන්නේ රුපියල් 6 කදීය.

09. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 60 - p$ $\qquad$ $Qs = p$

ඉහත භාණ්ඩයේ අධි සැපයුම ශුන්‍ය වන මිල වනුයේ,

1. රුපියල් 20 මිලේදීය.
2. රුපියල් 30 මිලේදීය.
3. රුපියල් 40 මිලේදීය.
4. රුපියල් 50 මිලේදීය.
5. රුපියල් 60 මිලේදීය.

10. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් ප්‍රමාණ ශ්‍රිතය පහතින් දැක්වේ.
$Qd = 50 - 0.5p$ වේ. මිල රුපියල් 10 දී පාරිභෝගික අතිරික්තය වනුයේ රුපියල්,

1. 180
2. 1 800
3. 8 100
4. 8 200
5. 2 025

11. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය හා සැපයුම් සමීකරණය පහත පරිදි වෙයි.

$Qd = 100 - p$ $\qquad$ $Qs = 0 + p$

ඉහත භාණ්ඩයේ ඉල්ලුම් හා සැපයුම් සමීකරණයන් පහත ආකාරයට වෙනස් විය.

$Qd = 120 - p$ $\qquad$ $Qs = 20 + p$

මෙහිදී ඔබට එකඟ විය හැකි ප්‍රකාශය කුමක් ද?

1. සමතුලිත මිල ඉහළ යන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවෙයි.
2. සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය වෙනස් නොවෙයි.
3. සමතුලිත මිල පහළ යන අතර සමතුලිත ප්‍රමාණය වැඩි වෙයි.
4. සමතුලිත මිල වෙනස් නොවන අතර සමතුලිත ප්‍රමාණය වැඩි වෙයි.
5. සමතුලිත මිලට හා සමතුලිත ප්‍රමාණයට කිසිදු බලපෑමක් සිදු නොවේ.

12. තරගකාරී වෙළෙඳපොළක කිසියම් භාණ්ඩයක් සඳහා රජය සහනාධාරයක් ලබා දුන්විට,

1. වෙළෙඳපොළ කාර්යක්ෂම නිමැවුමට වඩා අඩු නිමැවුමක් බිහිවේ.
2. පාරිභෝගික අතිරික්තය නොවෙනස්ව තිබිය දී නිෂ්පාදන අතිරික්තය වැඩිවේ.
3. පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය යන දෙකම වැඩිවේ.
4. පාරිභෝගිකයා ගෙවන මිල හා නිෂ්පාදකයා ලබන මිල යන දෙකම වැඩිවේ.
5. පාරිභෝගිකයා ගෙවන මිල නොවෙනස්ව තිබිය දී නිෂ්පාදකයා ලබන මිල පමණක් වැඩිවේ.

13. රජය පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන් උපරිම මිලක් නියම කළ විට,

1. වෙළෙඳපොළ කාර්යක්ෂම නිමැවුමට වඩා අඩු නිමැවුමක් බිහිවේ.
2. වෙළෙඳපොළේ අධි සැපයුමක් ඇති වේ.
3. අධි සැපයුම මිලට ගැනීමට රජය පිරිවැයක් දැරීමට සිදුවේ.
4. පාරිභෝගික අතිරික්තය වෙනස් නොවේ.
5. පාරිභෝගික අතිරික්තය පහළ ගොස් නිෂ්පාදන අතිරික්තය වැඩිවේ.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
SPED exam2021

14. කිසියම් භාණ්ඩයක ඉල්ලුම් නම්‍යතාව - 0.3 හා සැපයුම් නම්‍යතාව 1.2 වේ. මෙම භාණ්ඩයට රජය රු.5 ක බද්දක් පැනවූයේ නම්,

1. පාරිභෝගික බදු බර රු. 1 හා නිෂ්පාදන බදු බර රු. 4 කි.
2. භාණ්ඩයේ මිල රු. 4 කින් වැඩි වන අතර වැඩි බදු බර නිෂ්පාදකයා දැරිය යුතු වේ.
3. නිෂ්පාදකයා හා පාරිභෝගිකයා අතර සමානව බදු බර බෙදී යයි.
4. වැඩි බදු බර පාරිභෝගිකයා දරන අතර භාණ්ඩයේ මිල රු. 4 කි.
5. වැඩි බදු බර පාරිභෝගිකයා දරන අතර භාණ්ඩයේ මිල රු. 4 කින් වැඩි වේ.

15. ව්‍යාපාර ආයතනයක මුළු ස්ථාවර පිරිවැය රුපියල් 900 ක් වේ. එම ආයතනයේ නිමැවුමේ ආන්තික පිරිවැයේ හැසිරීම පහත වගුවෙන් දැක්වේ.

නිමැවුම	1	2	3	4	5	6
ආන්තික පිරිවැය	450	150	80	100	270	530

නිමැවුම ඒකක 4 දී සාමාන්‍ය මුළු පිරිවැය වන්නේ,

1. රුපියල් 1 700 කි.
2. රුපියල් 800 කි.
3. රුපියල් 420 කි.
4. රුපියල් 225 කි.
5. රුපියල් 200 කි.

16. පූර්ණ තරඟකාරී ආයතනයක් පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයකට මුහුණ දෙන්නේ,

1. නිෂ්පාදිතය සුවිශේෂී එකක් වන බැවිනි.
2. සමස්ත වෙළෙඳපොළ තුළ ඉතා නොවැදගත් සැපයුම්කරුවෙකු වන බැවිනි.
3.. සමස්ත ඉල්ලුම සපයන්නේ එකම ආයතනයක් වන බැවිනි.
4. ආයතන අතර අන්‍යොන්‍ය රැදියාවක් පවතින බැවිනි.
5. භාණ්ඩ ප්‍රභේදනයක් පවතින බැවිනි.

17. පූර්ණ තරඟකාරී ආයතනයක කෙටිකාලීන සැපයුම් වක්‍රය වන්නේ,

1. ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය මුළු පිරිවැය ඉක්ම වූ කොටසයි.
2. ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය ඉක්ම වූ කොටසයි.
3. ආන්තික පිරිවැය වක්‍රයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැය ඉක්ම වූ කොටසයි.
4. සාමාන්‍ය පිරිවැය වක්‍රයේ ආන්තික පිරිවැය ඉක්ම වූ කොටසයි.
5. සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රයේ ආන්තික පිරිවැය ඉක්ම වූ කොටසයි.

18. පහත දැක්වෙන රූප සටහන එක්තරා කර්මාන්තයකට අදාළ ශ්‍රම වෙළෙඳපොළ නිරූපණය කරයි.
වැටුප් අනුපාතය
(රුපියල්)



වෙළෙඳපොළ සැපයුම් වක්‍රය S_1 සිට S_2 දක්වා වෙනස් වුවහොත්, සංක්‍රාම ඉපයුම් සහ ආර්ථික බදු කුලිය කෙරෙහි ඇතිවන බලපෑම කවරක්වේද?

ආර්ථික බදු කුලිය	සංක්‍රාම ඉපැයීම
1. පහළ වැටෙයි	ඉහළ නගියි
2. පහළ වැටෙයි	පහළ වැටෙයි
3. නොවෙනස්ව පවතී	පහළ වැටෙයි
4. පහළ වැටෙයි	නොවෙනස්ව පවතී
5. ඉහළ නගියි	පහළ වැටෙයි

SPEDexam2021

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

19. උද්ධමන පීඩනයන්ගෙන් තොරව ආර්ථිකයකට නිපදවිය හැකි උපරිම තිරසාර නිමැවුම් මට්ටම විභව දළ දේශීය නිෂ්පාදිතය ලෙස හඳුන්වනු ලබයි. ඒ හා සම්බන්ධව ඉදිරිපත් වන පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි යයි සැලකෙන ප්‍රකාශය වනුයේ,

1. සම්පත් සම්භාරය සහ ඵලදායීතාවයේ වෙනස් වීම් සිදුවුවත් රටක විභව නිමැවුම වෙනස් නොවනු ඇත.
2. යුද ගැටුම්, දේශගුණික විපර්යාස, තාක්‍ෂණයේ පසුබැසීම් රටක විභව නිමැවුම දුබල කරනු ඇත.
3. විභව නිමැවුම රටක උපරිම නිමැවුම ලෙස සැලකිය හැකිවේ.
4. ආර්ථිකයක සම්පත් අසාමාන්‍ය වේගයෙන් උපයෝජනය කිරීමෙන් වඩාත් විශාල තිරසර නිමැවුමක් ලබාගත හැකිවේ.
5. රටක තාක්‍ෂණයේ විපර්යාස, ප්‍රාග්ධන ආයෝජනය වැඩි වීම සිදුවුවත් විභව නිමැවුමේ වෙනසක් සිදු නොවනු ඇත.

20. දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක්ද?

1. ප්‍රාථමික යෙදවුම් ලෙස හඳුන්වනුයේ නිෂ්පාදන ක්‍රියාවලයට යොදා ගැනෙන නිෂ්පාදන සාධක වේ.
2. නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා පිටතින් මිලදී ගනු ලබන භාණ්ඩ හා සේවා අතරමැදි යෙදවුම් ලෙස හඳුන්වනු ඇත.
3. නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කළ පසු අවසාන වන විදුලිය, ජලය, අමුද්‍රව්‍ය, ලිපිද්‍රව්‍ය, උපදේශන සේවා ප්‍රාථමික යෙදවුම්වල කොටසක් වේ.
4. නිෂ්පාදන ක්‍රියාවලිය මගින් බිහිවන භාණ්ඩ හා සේවා නිමැවුම ලෙස හඳුන්වනු ඇත.
5. නිෂ්පාදනය කරන ලද භාණ්ඩ හා සේවාවල මූල්‍යමය වටිනාකම නිමවුමේ දළ වටිනාකම ලෙස හඳුන්වනු ඇත.

21. ජාතික ගිණුම්කරණයේදී භාවිතා කරන මිලයන් සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1. නිෂ්පාදිතය මත අයකරන බදු සහ සහනාධාර පමණක් මූලික මිලට ඇතුළත් වේ.
2. පාරිභෝගිකයා සත්‍ය වශයෙන්ම භාණ්ඩ හා සේවා සඳහා ගෙවනු ලබන මිල මූලික මිල ලෙස සැලකෙනු ඇත.
3. මූලික මිලට අමතරව වෙළෙඳ ආන්තිකයන්, ප්‍රවාහන ගාස්තු, භාණ්ඩ හා සේවා මත බදු නිෂ්පාදකයාගේ මිලෙහි ඇතුළත්ය.
4. නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවන වෙනත් බදු හා එම සහනාධාර මූලික මිලට ඇතුළත් නොවේ.
5. ජාතික ගිණුම් පිළියෙල කිරීමේදී දළ දේශීය නිෂ්පාදිතය සෑම විටම වෙළෙඳ මිලට සැකසිය යුතුය.

22. කල්පිත ආර්ථිකකට අදාළ දත්ත පහත දැක්වේ.

අයිතමය	රුපියල් බිලියන
පෞද්ගලික පරිභෝජන වියදම	300
තොග වෙනස් වීම්	10
ශුද්ධ අපනයන	- 50
දළ දේශීය ප්‍රාග්ධන සම්පාදන වියදම	350
භාණ්ඩ සහ සේවා මත ශුද්ධ බදු	60
නිෂ්පාදනය මත වෙනත් බදු - එම සහනාධාර	20
රාජ්‍ය පරිභෝජන වියදම	200

මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය වෙළෙඳ මිල අනුව රු.බි

1. 800 කි
2. 810 කි
3. 820 කි
4. 860 කි
5. 870 කි

23. සරල ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතයේ ස්වාධීන පරිභෝජන වියදම 500 ක් වන අතර ආන්තික පරිභෝජන නැඹියාව 0.75 කි. ආර්ථිකයේ ස්වාධීන ආයෝජන වියදම 900 ක් වේ නම් සමතුලිත ජාතික ආදායම කොපමණද?

1. 1 400
2. 2 600
3. 4 400
4. 5 600
5. 6 400

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

24. විදේශ ගනුදෙනු සහ ආණ්ඩුවේ කටයුතු නොමැති ආර්ථිකයක ආයෝජන ගුණකයේ අගය 10 කි. එම ආර්ථිකයේ ආයෝජන මට්ටම රුපියල් මිලියන 300 කින් වැඩි වුවහොත් පරිභෝජන වියදම කොතරම් ප්‍රමාණයකින් වැඩිවනු ඇත්ද? (රුපියල් මිලියන)

1. 1 450
2. 2 300
3. 2 700
4. 2 900
5. 3 000

25. සරල ආර්ථිකයක ඉතුරුම් ශ්‍රිතය $S = -200 + 0.2y$ වේ. මෙම ආර්ථිකයේ සමතුලිත ජාතික ආදායම 2 500ක් වනු ඇත. ආර්ථිකයේ ආයෝජන වියදම කොපමණද?

1. 150
2. 300
3. 350
4. 450
5. 500

26. පහත දැක්වෙන සංරචක අතුරින් අධි බලැති මුදල් හෙවත් පදනම් මුදල් සංකල්පයට අයත් සංරචක ඇතුළත් නිවැරදි වරණය තෝරන්න.

A - මහජනතාව සතු ඉල්ලුම් තැන්පතු
B - මහජනතාව අතැති කාසි හා නෝට්ටු
C - විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල නේවාසික තැන්පතු
D - වාණිජ බැංකු අතැති මුදල්
E - වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු

1. A, B, D
2. C, E, D
3. B, C, E
4. B, D, E
5. A, B, E

27.

පුළුල් මුදල් සැපයුම (M_2)	රු.බි. 200
අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු වලින් (50%)	රු.බි. 150
විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වල නේවාසික තැන්පතු	රු.බි. 130
මහජනතාව වෙතැති කාසි හා නෝට්ටු	රු.බි. 140
වාණිජ බැංකු සතු සංචිත	රු.බි. 100
වාණිජ බැංකු මහ බැංකුවේ පවත්වාගෙන යන තැන්පතු	රු.බි. 50

ඉහත දත්ත අනුව ආර්ථිකයේ M2b පුළුල් මුදල් සැපයුමට අදාළ මුදල් ගුණකය වනුයේ,

1. 4 කි
2. 2 කි
3. 0.4 කි
4. 0.5 කි
5. 8 කි

28. පිළිනපත් වල මිල හෙවත් වටිනාකම,

1. පොලී අනුපාතික වෙනස්වීම නිසා වෙනසක් සිදු නොවේ.
2. පොලී අනුපාතික වෙනස් වීම සමඟ ධන සම්බන්ධයක් පෙන්නුම් කරයි.
3. පොලී අනුපාතික වෙනස් වීම සමඟ සෘණ සම්බන්ධයක් පෙන්නුම් කරයි.
4. සමපේක්ෂණ මුදල් ශේෂ සඳහා ඇති ඉල්ලුම වෙනස් වීම නිසා වෙනස් නොවේ.
5. ව්‍යාපාර කොටස්වල මිල වෙනස් වීම සමඟ සෘණ සම්බන්ධයක් පෙන්නුම් කරයි.

29. ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් මූල්‍ය ප්‍රතිපත්තියේ මෙහෙයුම් ඉලක්කය වන්නේ,

1. සංචිත මුදල්
2. M_4 මුදල් සැපයුම
3. හරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතය
4. M_2b මුදල් සැපයුම
5. ආසන්න මුදල්

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
SPED exam2021

30. නිත්‍ය ණය පහසුකම් අනුපාතය යනු,

1. දෛනික ණය දීමේ අනුපාතය වන අතර නිත්‍ය පොළී අනුපාත කොරිඩෝවේ ඉහළ සීමාවයි.
2. දෛනික ණය ගැනීමේ අනුපාතය වන අතර නිත්‍ය පොළී අනුපාත කොරිඩෝවේ පහළ සීමාවයි.
3. ප්‍රතිපත්තිමය පොළී අනුපාතයක් වන අතර වාණිජ බැංකු පෞද්ගලික අංශයට ණය දීමේ දී අදාළ පොළී අනුපාතයයි.
4. දෛනික ණය ගැනීමේ පොළී අනුපාතිකය වන අතර අන්තර් බැංකු ඒක්ෂණ පොළී අනුපාතයයි.
5. මහ බැංකුව රජයේ ණය ලබා දීමේ දී අයකරන පොළී අනුපාතයයි.

31. පහත සඳහන් භාණ්ඩ වර්ග අතුරින් පොදු භාණ්ඩ හා අර්ධ පොදු භාණ්ඩ නිවැරදිව පෙළ ගැස් වූ විට පිළිතුර කුමක්ද?

A - මාර්ග සංඥා   B - පාලම්   C - ජාතික ආරක්ෂාව
D - ගංවතුර වැළැක්වීම   E - මුහුදු වෙරළ   F - කෞතුකාගාරය

	පොදු භාණ්ඩ		අර්ධ පොදු භාණ්ඩ
1.	A, B, C	හා	D, E, F
2.	A, B, E	හා	C, D, F
3.	A, C, D	හා	B, E, F
4.	B, D, E	හා	A, C, F
5.	C, D, F	හා	A, B, C

32. වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බාහිර ගැලපුම් කළ පසු ප්‍රශස්ත නිමැවුම් මට්ටම පහත දැක්වේ.



ඉහත රූපසටහනේ (A-B) මගින් හා (Q_2-Q_1) මගින් දැක්වෙන දෑ නිවැරදිව සඳහන් වන පිළිතුර කුමක්ද?

	(A-B)	(Q_2-Q_1)
1.	බාහිර ප්‍රතිලාභ	වෙළෙඳපොළේ ඌණ පරිභෝජනය
2.	බාහිර ප්‍රතිලාභ	වෙළෙඳපොළේ අධි පරිභෝජනය
3.	බාහිර පිරිවැය	වෙළෙඳපොළේ අධි නිෂ්පාදනය
4.	බාහිර පිරිවැය	වෙළෙඳපොළේ ඌණ නිෂ්පාදනය
5.	බාහිර පිරිවැය	වෙළෙඳපොළේ ඌණ පරිභෝජනය

33. වෙළෙඳපොළ ආර්ථිකයක සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාව සඳහා අවශ්‍ය වන මූලික කොන්දේසි වනුයේ,

1. සමස්ත ඉල්ලුම, සමස්ත සැපයුමට සමාන වීමයි.
2. මිල ආන්තික පිරිවැයට සමාන වීමයි.
3. ධන බාහිරතා, සෘණ බාහිරතා වලට සමාන වීමයි.
4. පෞද්ගලික පිරිවැය, සමාජ පිරිවැයට සමාන වීමයි.
5. පෞද්ගලික ප්‍රතිලාභ, සමාජ ප්‍රතිලාභ වලට සමාන වීමයි.

SPED exam 2021

34. 2021 අයවැයෙන් කැළණිවැලි දුම්රිය මාර්ගය අවිස්සාවේල්ල දක්වා වැඩි දියුණු කිරීමට යෝජනා කොට ඇත. මෙහි ප්‍රතිලාභ ලෙස බිහිවිය හැකි ධන බාහිරතාවක් ලෙස සැලකිය හැක්කේ කවරක්ද?

1. දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ලාභ ඉහළ යාම.
2. දුම්රියේ ගමන් කරන මගීන්ගේ ගමන් කාලය ඉතිරි වීම.
3. කොළඹ - අවිස්සාවේල්ල මහා මාර්ගයේ සිදුවන වාහන තදබදය අඩු වීම.
4. දුම්රිය මාර්ගය දෙපස පිහිටි ඉඩම්වල මිල අඩු වීම.
5. පාසල් ළමුන් දුම්රියෙන් ගමන් කිරීම නිසා දුම්රිය දෙපාර්තමේන්තුවට ලැබෙන ආදායම වැඩි වීම.

35. මෑත කාලයේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් කුමන පරාසයක පිහිටියේ ද?

1. 5% - 7 %
2. 8% - 9%
3. 9% - 12%
4. 13% - 15%
5. 16% - 18%

36. X හා Y නැමති රටවල් දෙකෙහි, නිෂ්පාදිත දෙකක නිමවුම් ඒකකයක් සඳහා ශ්‍රම අවශ්‍යතාව පහත පරිදි වේ.

නිෂ්පාදිතය	X රට	Y රට
පරිගණකයක් සඳහා	4	5
ඔරලෝසුවක් සඳහා	2	6

ඉහත තොරතුරු අනුව වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

1. X රටට පරිගණක නිෂ්පාදනය මත විශේෂීකරණය වීමෙන් වාසි ලැබිය හැකිය.
2. Y රටට ඔරලෝසු නිෂ්පාදනය මත විශේෂීකරණය වීමෙන් වාසි ලැබිය හැකිය.
3. Y රටට පරිගණක අපනයනය කොට ඔරලෝසු ආනයනය කිරීමෙන් වාසි ලැබිය හැකිය.
4. නිරපේක්ෂ වාසි න්‍යාය අනුව විදේශ වෙළඳාමෙන් දෙරටට ම වාසි ලැබිය හැකිය.
5. සාපේක්ෂ වාසි න්‍යාය අනුව දෙරට අතර විදේශ වෙළඳාමක් හටගත නොහැකිය.

37. 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම් ව්‍යුහයට අදාල වඩාත් නිවැරදි පිළිතුර කුමක් ද?

	කෘෂිකාර්මික අපනයන (%)	**ආයෝජන භාණ්ඩ ආනයන (%)**
1.	20.6	23.1
2.	22.4	56.2
3.	56.2	26.1
4.	77.9	21.7
5.	78.9	57.0

38. කිසියම් වසරක රටක වෙළඳ ශේෂ අතිරික්තය පහළ යාමට හේතුවක් වනුයේ,

1. දේශීය උද්ධමනය පහළ යාමයි.
2. ව්‍යවහාර මුදල් ඒකකයේ අගය පහළ යාමයි.
3. රටතුලට ගලාඑන සෘජු විදේශ ආයෝජන ප්‍රවාහ පහළ යාමයි.
4. වෙළඳ හවුල්කාර රටවල් විසින් පහළ තීරුබදු පැනවීමයි.
5. භාණ්ඩ අපනයන ආදායම් පහළ යාම සහ භාණ්ඩ ආනයන වියදම් ඉහළ යාමයි.

39. එක්තරා වර්ෂයක ශ්‍රී ලංකාවේ මුලු විදේශ වත්කම් ප්‍රමාණය රු.මි 250 කි. එම වර්ෂයට පෙර වර්ෂයේ ආනයන වියදම රු.මි 1000 කි. ඒ අනුව විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාවය,

1. මාස 2 යි
2. මාස 3 යි
3. මාස 3.5 යි
4. මාස 4 යි
5. මාස 5 යි

SPEDexam2021

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

40. පහත දී ඇති ගෙවුම් ශේෂ ලේඛනයක ඇතුලත් දත්ත එහි කවර ගිණුම් වලට අයත් වේද යන්න පිළිවෙලින් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.

(අ) පරිගණක හා තොරතුරු සේවා ආදායම්
(ආ) වරාය සංවර්ධන සඳහා විදේශ ඍජු ආයෝජන
(ඉ) මූල්‍ය නොවන රත්‍න් ඉපයුම්
(ඊ) නේවාසික භාවය ආරක්ෂා කර ගනිමින් විදේශ වලින් ඉපයූ සේවක වැටුප්

1. සේවා ගිණුම, මූල්‍ය ගිණුම, භාණ්ඩ ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුම
2. සේවා ගිණුම, ප්‍රාග්ධන ගිණුම, භාණ්ඩ ගිණුම, මූල්‍ය ගිණුම
3. ප්‍රාථමික ආදායම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම, භාණ්ඩ ගිණුම, මූල්‍ය ගිණුම
4. ප්‍රාථමික ආදායම් ගිණුම, මූල්‍ය ගිණුම, භාණ්ඩ ගිණුම, ප්‍රාග්ධන ගිණුම
5. ද්විතීක ආදායම් ගිණුම, ප්‍රාග්ධන ගිණුම, සේවා ගිණුම, මූල්‍ය ගිණුම

41. ශ්‍රී ලංකාවේ ඩොලරයේ රුපියල් අගය රු. 190 සිට රු. 200 දක්වා වෙනස් වේ නම් පහත ප්‍රකාශ අතුරින් න්‍යායාත්මකව නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?

1. ශ්‍රී ලංකාවේ භාණ්ඩ වල මිල ඇමරිකානු වෙළඳපොලේ පෙරට වඩා වැඩි වේ
2. ඇමරිකානු භාණ්ඩ ශ්‍රී ලංකා වෙළඳපොලේ පෙරට අඩු වේ
3. ශ්‍රී ලාංකිකයින් වැඩි වැඩියෙන් ඇමරිකාවේ සංචාරයට ආකර්ෂණය වේ
4. ඇමරිකානුන් වැඩි වැඩියෙන් ශ්‍රී ලාංකාවේ සංචාරයට ආකර්ෂණය වේ
5. ශ්‍රී ලංකාවේ අපනයන අඩුවී ආනයන වැඩි වේ

42. එක්තරා ආර්ථිකයකට අදාල ව විදේශ මූල්‍යයට අදාල වසර අවසානයේ දැක ගත හැකි දත්ත කිහිපයක් එක්සත් ජනපද ඩොලර් මිලියන වලින් පහත දැක්වෙයි.

	2019	**2020**
රජයේ විදේශ වත්කම්	300	250
මහ බැංකුවේ විදේශ වත්කම්	600	500
තැන්පතු භාර ගන්නා ආයතන වල විදේශ වත්කම්	1 250	1 000
නිල සංචිත වලට අදාල වගකීම්	300	200

ඉහත දත්ත අනුව මෙම ආර්ථිකයේ 2020 වර්ෂයට අදාල ව ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය වනුයේ ජනපද ඩොලර් මිලියන,

1. -50 කි
2. 100 කි
3. -250 කි
4. 300 කි
5. 800 කි

43. සංවර්ධනය යන්නෙන් අදහස් කරනුයේ,

1. මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයයි
2. මූර්ත නිමවුම ඉහළ යාමත් සමඟ ආර්ථික ව්‍යුහයේ වෙනස් කම් සිදු වීමයි
3. ආර්ථික වෘද්ධියත් සමඟ ඇති වන්නා වූ මිනිස් ජීවිත වල ගුනාත්මක වර්ධනයයි
4. ආර්ථික සමාජීය හා පාරිසරික යන පැති කඩ තුනෙහි සමබර වර්ධනයයි
5. ආර්ථික උත්පාත හා අවපාත වලින් තොරව ආර්ථිකය ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීමයි

44. විභව නිමවුම සම්බන්ධ පහත ප්‍රකාශ අතුරුන් වැරදි ප්‍රකාශය වන්නේ කුමක්ද?

1. උද්ධමන පීඩනයකින් තොරව ආර්ථිකයට ලඟා කර ගත හැකි නිමවුමක් වේ
2. ආර්ථිකයකට නිපදවිය හැකි උපරිම නිමවුමක් වේ
3. නිෂ්පාදන හැකියා මායිමේ පිහිටි නිමවුමක් වේ
4. ව්‍යාපාර චක්‍රයක උපනති රේඛාවේ පවතින නිමවුමක් වේ
5. තිරසාර ලෙස පවත්වා ගත හැකි නිමවුමක් වේ

45. ජනගහන දරිද්‍රතා දර්ශකය මගින් පෙන්නුම් කරනුයේ,

1. දිළිඳු ජනගහනයේ ප්‍රමාණය කොපමණද යන්නයි
2. දිළිඳු ජනගහනයේ ප්‍රමාණය මුලු ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද යන්නයි
3. පුද්ගලයෙකුට දෛනිකව අවශ්‍ය වන අවම කැලරි ප්‍රමාණය කොපමණද යන්නයි
4. පුද්ගලයකුට තම මූලික අවශ්‍යතා සපුරා ගානීමට ප්‍රමාණවත් අවම ආදායම කොපමණද යන්නයි
5. සාපේක්ෂ දරිද්‍රතා මට්ටම කොපමණද යන්නයි

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

46. සමාජයේ සියලුම ආදායම කුටුම්භ 1% ක් අතර සමුච්චනය වීතිබේ නම් ගිණි සංගුණකය හා ලෝරන්ස් වක්‍රය, පිළිබඳ පහත ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය වනුයේ කුමක් ද?

1. ගිණි සංගුණකය ශුන්‍ය වන අතර ලෝරන්ස් වක්‍රය 45^0 රේඛාව මත පතිත වේ
2. ගිණි සංගුණකය 1 වන අතර ලෝරන්ස් වක්‍රය දකුණු පස තිරස් හා සිරස් අක්ෂ මත පතිත වේ
3. ගිණි සංගුණකය 1 වන අතර ලෝරන්ස් වක්‍රය 45^0 රේඛාව මත පතිත වේ
4. ගිණි සංගුණකය ශුන්‍ය වන අතර ලෝරන්ස් වක්‍රය දකුණු පස තිරස් හා සිරස් අක්ෂ මත පතිත වේ
5. කුටුම්භ ආදායම් ව්‍යාප්තිය පිළිබඳ කිසිදු නිගමනයකට එළඹිය නොහැකි වේ

47. වර්තමාන ශ්‍රී ලංකාවේ ඉහලම දරිද්‍රතා දර්ශකය පෙන්නුම් කරන දිස්ත්‍රික්කය හා පලාත පිළිවලින්,

1. මඩකලපුව දිස්ත්‍රික්කය හා ඌව පළාතයි
2. මුලතිව් දිස්ත්‍රික්කය හා නැගෙනහිර පළතයි
3. කිලිනොච්චි දිස්ත්‍රික්කය හා උතුරු පළාත යි
4. කිලිනොච්චි දිස්ත්‍රික්කය හා ඌව පළාත යි
5. වවුනියා දිස්ත්‍රික්කය හා සබරගමු පළාතයි

48. ඉහලම ආදායම් ලබන රටවල් හදුනා ගැනීම 2020 ජූලි මාසයේ ලෝක බැංකුව විසින් ප්‍රකාශිත ලෝක සංවර්ධන වාර්තාව අනුව ප්‍රතිශීර්ෂ ආදායම් නිර්ණායකය වන්නේ,

1. ඇමරිකන් ඩොලර් 12535 **හා** ඊට වැඩි වීම යි
2. ඇමරිකන් ඩොලර් 10225 **හා** ඊට වැඩි වීම යි
3. ඇමරිකන් ඩොලර් 10205 **හා** ඊට වැඩි වීම යි
4. ඇමරිකන් ඩොලර් 8075 **හා** ඊට වැඩි වීම යි
5. ඇමරිකන් ඩොලර් 7085 **හා** ඊට වැඩි වීම යි

49. 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ලද දායකත්වය පිළිවෙලින් දැක් වෙනුයේ,

1. වෙළදාම ප්‍රවාහන සේවා නවාතැන් සැපයීම හා ආහාර සැපයීමේ සේවාවන්, නිෂ්පාදන කර්මාන්ත, මූල්‍ය රක්ෂණ හා නිවාස අයිතිය සහ දේපළ වෙළදාම්
2. වෙළදාම ප්‍රවාහන සේවා නවාතැන් සැපයීම හා ආහාර සැපයීමේ සේවාවන්, මූල්‍ය රක්ෂණ හා නිවාස අයිතිය සහ දේපළ වෙළදාම්, නිෂ්පාදන කර්මාන්ත
3. නිෂ්පාදන කර්මාන්ත, වෙළදාම ප්‍රවාහන සේවා නවාතැන් සැපයීම හා ආහාර සැපයීමේ සේවාවන්, මූල්‍ය රක්ෂණ හා නිවාස අයිතිය සහ දේපළ වෙළදාම්
4. නිෂ්පාදන කර්මාන්ත, මූල්‍ය රක්ෂණ වෙළදාම ප්‍රවාහන සේවා නවාතැන් සැපයීම හා ආහාර සැපයීමේ සේවාවන් හා නිවාස අයිතිය සහ දේපළ වෙළදාම
5. වෙළදාම ප්‍රවාහන සේවා නවාතැන් සැපයීම හා ආහාර සැපයීමේ සේවාවන්, නිවාස අයිතිය සහ දේපළ වෙළදාම්, නිෂ්පාදන කර්මාන්ත

50. ගෝලීය ශ්‍රේණිගත කිරීම් අනුව ගෝලීය තරගකාරිත්ව දර්ශකය හා ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිලිබඳ දර්ශකය අනුව 2019 වර්ෂයේදී ශ්‍රී ලංකාව ලබා ගෙන තිබෙන ස්ථානය පිළිවෙලින්,

1. රටවල් 184 ක් අතුරින් 98 ස්ථානය හා රටවල් 190 ක් අතුරින් 98 ස්ථානය
2. රටවල් 190 ක් අතුරින් 98 ස්ථානය හා රටවල් 141 ක් අතුරින් 84 ස්ථානය
3. රටවල් 141 ක් අතුරින් 84 ස්ථානය හා රටවල් 190 ක් අතුරින් 98 ස්ථානය
4. රටවල් 190 ක් අතුරින් 98 ස්ථානය හා රටවල් 141 ක් අතුරින් 84 ස්ථානය
5. රටවල් 180 ක් අතුරින් 94 ස්ථානය හා රටවල් 141 ක් අතුරින් 98 ස්ථානය

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணத் கல்வித் திணைக்கள
Department of Education – Southern Province

21 | S | II

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021
General Certificate of Education (Advanced Level) Examination - 2021

තෙවන වාර පරීක්ෂණය - 2021
Third Term Test – 2021

13 ශ්‍රේණිය Grade 13	ආර්ථික විද්‍යාව - II Economic – II	පැය තුනයි 03 hours

උපදෙස් :
- ‘අ’ කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද ‘ආ’ කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

“අ” කොටස

01. I. (අ) මිනිස් අවශ්‍යතා (Human Needs) සහ මිනිස් වුවමනා (Human Wants)යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 02)

(ආ) නිෂ්පාදන සාධකයක් ලෙස ව්‍යවසායකත්වය සහ ශ්‍රමය යන සංකල්ප අර්ථකතනය කරන්න. (ලකුණු 02)

II. ස්ථාවර ප්‍රාග්ධනයේ ප්‍රධාන සංරචක වශයෙන් නිෂ්පාදනයට ආධාර කෙරෙන මූර්ත වත්කම් නම් කරන්න. (ලකුණු 04)

III. (අ) සමාජයක් තුළ සිටින කුටුම්බ, ව්‍යාපාරික ආයතන, ආණ්ඩුව හා වෙනත් සංවිධාන විවිධ තේරීම් කරනු ලබන ආකාරය ආර්ථික විද්‍යාව තුළ අධ්‍යයනය කෙරෙයි. එම තේරීම් පිළිබඳ ප්‍රශ්නය සෑම සමාජයකටම පොදු වීමට බලපාන සාධක කවරේද? (ලකුණු 02)

(ආ) ආවස්ථික පිරිවැය සංකල්පය ආර්ථික විද්‍යාත්මකව අර්ථකතනය කරන්න. (ලකුණු 02)

IV. (අ) ධනේශ්වර, සමාජවාදී, වෙළෙඳපොළ සහ විධානගත ලෙස න්‍යායාත්මකව ආර්ථික පද්ධති වර්ගීකරණය කරනු ලබන විද්‍යාත්මක ප්‍රවේශයන් හඳුන්වා දෙන්න. (ලකුණු 02)

(ආ) ලාභය විසින් වෙළෙඳපොළ ආර්ථිකය තුළ ඉටුකරනු ලබන කාර්යයන් 04 ක් දක්වන්න. (ලකුණු 02)

V. “වර්තමානයේ ආර්ථිකය තම හිඟ සම්පත් භාවිතා කරනු ලබන ආකාරය මත එම ආර්ථිකයට උරුමවන අනාගත නිෂ්පාදන හැකියාව තීරණය වේ.” නිෂ්පාදන හැකියා මායිම් වක්‍ර රූප සටහන් භාවිතා කරමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

02. I. සාමාන්‍ය භාණ්ඩයක මිල අඩුවීමේ ආදේශන ප්‍රතිවිපාකය පැහැදිළි කරන්න. (ලකුණු 03)

II. "ඉල්ලුම් න්‍යාය ඉල්ලුම් නීතියට වඩා පුළුල් සංකල්පයකි." පැහැදිළි කරන්න. (ලකුණු 03)

III. ''සෑම ලක්ෂයකම මිල ඉල්ලුම් නම්‍යතාවය නියත අගයක් ගනු ලබන්නේ ඍජුකෝණාශ්‍රාකාර බහුවලයක හැඩය ගන්නා ඉල්ලුම් වක්‍රයක පමණි.'' ඔබ එකග වන්නේ ද පිළිතුර පැහැදිළි කරන්න. (ලකුණු 03)

IV. කිසියම් භාණ්ඩයක් සඳහා වන ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

$Qd = 30 - 2p$

$Qs = - 6 + 2p$

ඉහත තොරතුරු ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය වීජ ගණිතමය ලෙස ලබාගෙන එය ප්‍රස්ථාර සටහනක දක්වන්න. (ලකුණු 03)

(ආ) වෙළෙඳපොළ සමතුලිතයේ දී ආර්ථික අතිරික්තයේ වටිනාකම කොපමණ ද? (ලකුණු 04)

(ඉ) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතා සහ සැපයුම් නම්‍යතා සංගුණක වල අගයන් දක්වන්න. (ලකුණු 02)

(ඊ) මෙම භාණ්ඩයේ මිල රුපියල් 3 දී අධි ඉල්ලුම හා ප්‍රමාණය ඒකක 6 දී අධි ඉල්ලුම් මිල කොපමණද? (ලකුණු 02)

03. I. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් කහ ආනයනය නවතා දැමීම නිසා ඇති වූ තත්ත්වය හමුවේ දේශීය කහ නිෂ්පාදකයා දිරිගැන්වීම සඳහා රජය විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරමින් සිටියි. දේශීය කහ වෙළෙඳපොළට අදාළ ඉල්ලුම් ශ්‍රිතය හා සැපයුම් ශ්‍රිතය පහත දැක්වේ.

$Qd = 200 - 2p$ $Qs = - 40 + 4p$

ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය (ලකුණු 02)

(ආ) කහ කිලෝවක් සඳහා රජය රු. 50 ක අවම මිලක් නියම කළේ නම්, එම මිලට අධි සැපයුම මිලට ගැනීමට රජය දරන වියදම (ලකුණු 02)

(ඇ) අධි සැපයුම මිලට ගැනීමෙන් පසු පාරිභෝගික අතිරික්තය සහ නිෂ්පාදන අතිරික්තය (ලකුණු 02)

(ඉ) අධි සැපයුම මිලට ගැනීම නිසා අහිමි වූ ශුභසාධනය (ලකුණු 02)

(ඊ) දේශීය ගොවීන් ආරක්ෂාකර ගැනීම සඳහා **අධි සැපයුම මිලට ගැනීම**ට අමතරව ගත හැකි වෙනත් ක්‍රියාමාර්ග මොනවාද? (ලකුණු 02)

II. පහත සඳහන් රජයේ ක්‍රියාමාර්ග රජයේ බදු ආදායම, පාරිභෝගික බදු බර හා නිෂ්පාදක බදු බර කෙරෙහි බලපාන ආකාරය ප්‍රස්තාර සටහන් යොදා ගනිමින් පැහැදිළි කරන්න.

(අ) සාපේක්ෂ වශයෙන් නම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බද්දක් පැනවීම

(ආ) සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බද්දක් පැනවීම

(ඇ) පූර්ණ අනම්‍ය සැපයුමක් සහිත භාණ්ඩයක් මත බද්දක් පැනවීම (ලකුණු 06)

III. රජය නිෂ්පාදකයාට සහනාධාර සැපයීමේ අවාසි මොනවාද? (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

04. I. හීනවන ආන්තික ඵලදා නීතිය යනු කුමක්ද? එම නීතියට පදනම් වන උපකල්පන මොනවාද? (ලකුණු 03)

II. එක්තරා නිෂ්පාදන ආයතනයක 2020 නොවැම්බර් මාසය සඳහා වන දත්ත සමහරක් මතු දැක්වේ.

	රුපියල්
ගොඩනැගිලි සඳහා බදු ගෙවීම්	16 000
ඉන්ධන පරිභෝජනය	5 000
රක්ෂණ වාරික ගෙවීම්	19 000
අමු ද්‍රව්‍ය මිලදී ගැනුම්	40 000
ඍජු ශ්‍රම වියදම්	15 000
ප්‍රාමාණික ලාභය	25 000
ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවීම්	20 000

අදාළ කාලය තුළ මුළු නිෂ්පාදනය ඒකක 200 ක් වූ අතර එක් ඒකකයක් අලෙවි කල මිල රුපියල් 750 ක් විය.
ඉහත තොරතුරු පදනම් කර ගනිමින් පහත දේ ගණනය කරන්න.

a. සාමාන්‍ය ස්ථාවර පිරිවැය b. සාමාන්‍ය විචල්‍ය පිරිවැය c. ඒකකයක ලාභය (ලකුණු 06)

III. කෙටි කාලීන ආන්තික පිරිවැය වක්‍රය සහ සාමාන්‍ය පිරිවැය වක්‍රය අතර සම්බන්ධතාව ප්‍රස්ථාර සටහනක් මඟින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

IV. ඒකාධිකාරී තරඟ වෙළෙඳපොළක් හා කතිපයාධිකාරී වෙළෙඳපොළක් අතර වෙනස්කම් දක්වන්න. (ලකුණු 03)

V. පහත එකිනෙක ප්‍රකාශයට අදාළ මූලික හේතුව ඔබ පැහැදිළි කරන්නේ කෙසේද?

(අ) නිෂ්පාදන ක්‍රියාවලියක නිමැවුම ශුන්‍ය වුවද මුළු පිරිවැයක් පවතී
(ආ) සාමාන්‍යයෙන් ගිණුම්කරණ පිරිවැයට වඩා ආර්ථික පිරිවැය වැඩි අගයක් ගනියි.
(ඉ) පූර්ණ තරගකාරී වෙළෙඳපොළ ආයතනයකට ආර්ථික ලාභ ශුන්‍ය වීම අවාසිදායක තත්ත්වයක් නොවේ.
(ඊ) නිෂ්පාදන සාධකයකට පවතින්නේ ව්‍යුත්පන්න ඉල්ලුමකි. (ලකුණු 04)

05. I. (අ) "දළ එකතු කළ අගය" සංකල්පය පැහැදිළි කරන්න. (ලකුණු 02)
(ආ) නිෂ්පාදන ක්‍රියාවක දළ එකතු කළ අගය ගණනය කළ හැකි ආකාර හඳුන්වා දෙන්න. (ලකුණු 02)

II. කල්පිත ආර්ථිකයක් සඳහා පහත සඳහන් දත්ත ඔබ වෙත දී ඇත.

අයිතමය	(රුපියල් මිලියන)	
සේවක ආදායම්	5 000	
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම්		2 000
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය		12 000
මිශ්‍ර ආදායම්	4 000	
නිෂ්පාදනය මත වෙනත් බදු - එම සහනාධාර		3 000
සමාහාර පරිභෝජන වියදම	26 000	
අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ වර්තන සංක්‍රාම	5 000	
අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ ප්‍රාථමික ආදායම්		-1 000
භාණ්ඩ හා සේවා මත බදු - එම සහනාධාර	4 000	

ඉහත දත්ත පදනම් කර ගනිමින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල යටතේ දළ එකතු කළ අගය (ලකුණු 02)
(ආ) ශුද්ධ දේශීය නිෂ්පාදිතය (ලකුණු 02)
(ඉ) වැය කළ හැකි දළ ජාතික ආදායම (ලකුණු 02)
(ඊ) ජාතික ඉතිරි කිරීම් (ලකුණු 02)

III. ජාතික ආදායමේ සමතුලිත මට්ටම යනුවෙන් අදහස් කරනුයේ කුමක්ද? එය නිර්ණය කිරීම සඳහා යොදා ගැනෙන ප්‍රවේශ හඳුන්වා දෙන්න. (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

IV. කිසියම් ආර්ථිකයක් පිළිබඳ පහත දැක්වෙන සාර්ව ආර්ථික දත්ත සැලකිල්ලට ගන්න.

$C = 180 + 0.8Y_d$

ආයෝජන වියදම(I) = 300

ආණ්ඩුවේ මිලදී ගැනීම් (G) = 600

බදු අයකිරීම් (T) = 450

සංක්‍රාම (Tr) = 225

(අ) සමතුලිත ජාතික ආදායම ගණනය කරන්න. (ලකුණු 02)

(ආ) වැයකළ හැකි කුටුම්බ (පෞද්ගලික) ආදායම ගණනය කරන්න. (ලකුණු 01)

(ඉ) ඉතිරි කිරීම් ශුන්‍යවන ආදායම ගණනය කරන්න. (ලකුණු 01)

"ආ" කොටස

06. I. "අධි බලැති මුදල්" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

II. M_2b හෙවත් ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුමට ඇතුළත් සංරචක දක්වන්න. (ලකුණු 04)

III. කිසියම් ආර්ථිකයක වාණිජ බැංකු පද්ධතියක මූල්‍ය තත්ත්ව ප්‍රකාශයක් (ශේෂ පත්‍රයක්) පහත දැක්වේ. (වටිනාකම් රුපියල් මිලියන වලිනි)

වගකීම්		වත්කම්	
තැන්පත්	15 000	මුදල් සංචිත	5 000
		ණය	10 000
	15 000		15 000

ආර්ථිකයේ M_1 මුදල් සැපයුම - 20 000

ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව - 20%

(අ) බැංකු පද්ධතියේ පවතින අධි සංචිත කොපමණද? (ලකුණු 02)

(ආ) අධි සංචිත ඇසුරින් බැංකු පද්ධතිය ලබා දී ඇති මුළු ණය කොපමණද? (ලකුණු 02)

(ඉ) උපරිම ණය ලබාදුන් පසු බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය ලියන්න. (ලකුණු 02)

(ඊ) ණය ලබාදීමෙන් පසු M_1 මුදල් සැපයුම කොපමණද? (ලකුණු 02)

IV. "ශ්‍රී ලංකාවේ මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්තිය නම්‍යශීලී උද්ධමන ඉලක්ක කරනය මුල්කොට ගෙන පවතී." පැහැදිළි කරන්න. (ලකුණු 03)

V. සැපයුම් පාර්ශවීය උද්ධමනය යන්න හඳුන්වා ඒ සඳහා බලපෑ හැකි සාධක දක්වන්න. (ලකුණු 03)

07. I. "වෙළෙඳපොළ යාන්ත්‍රණයේ ප්‍රතිලාභ පූර්ණ වශයෙන් සාක්ෂාත් කරගත හැකි වනුයේ පූර්ණ තරගකාරී තත්ත්වයක් තුළ හටගන්නා, සංවරණ හා තුලන (Check and Balances) නිසි ලෙස ක්‍රියාත්මක වේ නම් පමණි." එහෙත් වර්තමානයේ බොහෝ රටවල වෙළෙඳපොළ යාන්ත්‍රණය අපොහොසත් වීම කෙරෙහි බලපා ඇති ප්‍රබල හේතු මොනවාද? (ලකුණු 04)

II. පහත සංකල්ප අතර වෙනස පැහැදිළි කරන්න.

(අ) පෞද්ගලික භාණ්ඩ හා පොදු භාණ්ඩ

(ආ) ශුභසාධන භාණ්ඩ හා අවගුණ භාණ්ඩ (ලකුණු 04)

III. "කොවිඩ්-19 රෝගයෙන් වැලකී සිටීමට, වෙළෙඳපොළේ අලෙවිවන එන්නතක් ලබා ගැනීමට ශ්‍රී ලාංකිකයින් බොහෝ දෙනෙකු කැමැත්තක් දක්වයි." ඒ තුළින් හටගත හැකි සම්පත් උපයෝජනයේ ස්වරූපය උචිත රූප සටහන් ඇසුරින් පැහැදිළි කරන්න. (ලකුණු 04)

IV. වෙළෙඳපොළ ක්‍රමයක් තුළ "ආණ්ඩුව අසමත්වීම" (Government Failure) යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද? එවැනි අසමත්වීම් හටගැනීම කෙරෙහි බලපාන හේතු මොනවාද? (ලකුණු 04)

V. ශ්‍රී ලංකාවේ පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් කවරේ ද? ඒ සඳහා බලපා ඇති සාධක කවරේ ද? (ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

08. අ) I. නිරපේක්ෂ වාසි හා සාපේක්ෂ වාසි අතර වෙනස ජාත්‍යන්තර වෙළඳාමට පදනම් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04)

II. "තරඟකාරීත්ව වාසිය" යන සංකල්පයෙන් කුමක් අදහස් කරන්නේ ද යන්න සමස්ත ආර්ථිකයක් ඇසුරෙන් පැහැදිලි කොට එහි මූලාශ්‍ර දක්වන්න. (ලකුණු 05)

III. "X" නැමති භාණ්ඩය නිෂ්පාදකයකු රු.500 ක් වටිනා ආනයන යෙදවුම් භාවිත කොට රු.1500 කට දේශීය වෙළඳපොළට සපයන අතර ඒ හා සමාන වූ ආනයන භාණ්ඩය ද අබාධ වෙළඳාම යටතේ දේශීය වෙළඳපොළේ රු.1500 ට අලෙවි කරයි. ආනයන කළ "X" භාණ්ඩය මත 10% ක තීරු බද්දක් හා ආනයන යෙදවුම් මත 5% ක තීරු බද්දක් පැනවී නම් සඵල ආරක්ෂණ අනුපාතය ගණනය කරන්න. (ලකුණු 03)

ආ) I. එක්තරා කල්පිත ආර්ථිකයක ගෙවුම් තුලන ලේඛනයට අදාල ගණුදෙනුවල සාරාංශයක් පහත දැක්වේ. (සියලු සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

	හර	බැර
වෙළඳ භාණ්ඩ	3600	2400
රක්ෂණ	40	60
සංචාරක	20	120
පොළී හා ලාභ	50	10
ප්‍රවාහන	240	280
සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ	160	600
මූල්‍ය සේවා	30	50
ප්‍රාග්ධන සංක්‍රාම	20	180
මූල්‍ය රන්	30	50
සේවක වැටුප්	24	14

ඉහත දත්ත ඇසුරින් පහත සඳහන් දෑ ගණනය කරන්න.

A - වෙළඳ ගිණුමේ ශේෂය (ලකුණු 01)
B - සේවා ගිණුමේ ශේෂය (ලකුණු 01)
C - ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය (ලකුණු 01)
D - ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය (ලකුණු 01)

II. නිල විදේශ සංචිත වත්කම් වලට කුමක් අයත් වේ ද? ඒවායේ සීඝ්‍ර අඩුවීමක ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04)

09. I. ආර්ථික වෘද්ධිය යන්නෙන් කුමක් අදහස් වේ ද? එය තීරණය කෙරෙන ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04)

II. ශ්‍රී ලංකාවේ ජනගහනය වයස්ගත වීමේ ප්‍රතිවිපාක සහ එයට මුහුණ දීමට ඉදිරිපත් කල හැකි යෝජනා දක්වන්න. (ලකුණු 04)

III. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මනිනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 04)

IV. රටක දිළිඳුකම තුරන් කිරීම සඳහා ආර්ථික වෘද්ධිය ප්‍රමාණවත් කොන්දේසියක් ද? පැහැදිලි කරන්න.(ලකුණු 04)

V. රටක ආයෝජනය ආකර්ශනය ඉහළ නැංවීම සඳහා වැඩි දියුණු කළ යුතු ක්ෂේත්‍ර සඳහන් කරන්න. (ලකුණු 04)

10. I. එක්සත් ජාතීන්ගේ කමිටු නිර්දේශය අනුව ආහාර සුරක්ෂිතතාවය අර්ථ දක්වන්න. (ලකුණු 03)

II. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ පවත්නා ගැටලු හා ආශ්‍රිත කරුණු සලකා බලන විට අභියෝගයන් රාශියක් පවතී. එවැනි අභියෝගයන් කවරේද? (ලකුණු 04)

III. සිව්වන කාර්මික විප්ලවයට (4 IR) මුහුණ දීමට ශ්‍රී ලංකාවට පවත්නා අභියෝගයන් කවරේ ද? (ලකුණු 04)

IV. ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දී තිබෙන අභ්‍යන්තර හා බාහිර අර්බුදයන් ඔබ පැහැදිලි කරන්නේ කෙසේ ද? (ලකුණු 04)

SPED Exam

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

V. ගෝලීය ශ්‍රේණිගත කිරීමේ දර්ශක අනුව දැනුම් ආර්ථිකය පිළිබඳ දර්ශකයෙහි සතුටුදායක තත්ත්වයකට ශ්‍රී ලංකාවට ළඟා වීමට තිබෙන අභියෝගයන් දෙකක් දක්වා වෙනත් ගෝලීය ශ්‍රේණිගත කිරීමේ දර්ශක තුනක් දක්වන්න. (ලකුණු 05)

SPED Exam

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

<u>රහසයායි පිළිතුරු පත් ඇගයීම් කටයුතු සඳහා පමණි.</u>

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආර්ථික විද්‍යාව - I පත්‍රය - පිළිතුරු
13 ශ්‍රේණිය

01 - 5	11 - 4	21 - 5	31 - 3	41 - 4
02 - 4	12 - 3	22 - 1	32 - 3	42 - 1
03 - 1	13 - 1	23 - 4	33 - 2	43 - 3
04 - 4	14 - 5	24 - 3	34 - 3	44 - 2
05 - 5	15 - 3	25 - 2	35 - 3	45 - 2
06 - 2	16 - 2	26 - 4	36 - 3	46 - 2
07 - 2	17 - 3	27 - 2	37 - 1	47 - 3
08 - 5	18 - 5	28 - 3	38 - 5	48 - 1
09 - 2	19 - 2	29 - 3	39 - 2	49 - 1
10 - 5	20 - 3	30 - 1	40 - 1	50 - 3

II පත්‍රය - පිළිතුරු

<u>''අ'' කොටස</u>

01. I. (අ) සමාජයක් තුළ පුද්ගලයෙකු වශයෙන් ජීවත් වීමට අවශ්‍ය අවම දේවල් මිනිස් අවශ්‍යතා ලෙස හැඳින්වේ. ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය මූලික දේවල් මිනිස් අවශ්‍යතා වේ.
උදා:- ආහාර, ඇඳුම්, වාසස්ථාන **(ලකුණු 01)**

අවශ්‍යතා සපුරාගැනීම සහ තෘප්තිය වැඩිකර ගැනීමට මිනිසා විසින් තෝරාගනු ලබන විවිධ ආකාර විවිධ ස්වරූප නැතිනම් විවිධ ක්‍රම මිනිස් වුවමනා ලෙස හැඳින්වෙනු ඇත. අවශ්‍යතා තුළින් වුවමනා ඇති වේ.

උදා:- ආහාර අවශ්‍යතාවයකි. ඒ තුළින් පැනනගින බත්, පාන්, ආප්ප, පිට්ටු ආදිය වුවමනා මිල ඇතුළත් වේ. **(ලකුණු 01)**

(ආ) භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම පිණිස ශ්‍රමය භූමිය සහ ප්‍රාග්ධනය යන නිෂ්පාදන සම්පත් සංවිධානය කොට මෙහෙය වීමේ ලා ඇතැම් පුද්ගලයින් සතු සුවිශේෂී හැකියාව ව්‍යවසායකත්වය ලෙස හැඳින්වෙනු ඇත. **(ලකුණු 01)**

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ දී යොදාගත හැකි මිනිසුන්ගේ කායික හෝ මානුෂික ප්‍රයත්නය වේ. **(ලකුණු 01)**

II.
- මෙවලම් සහ උපකරණ (උදළු,කැති,පොරෝ)
- යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ (මහන මැෂින්,විදුලි බලාගාර)
- නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනෙන ගොඩනැගිලි (කර්මාන්තශාලා,ගබඩා)
- අවි ආයුධ පද්ධති (ප්‍රහාරක යාත්‍රා,කාලතුවක්කු)
- ප්‍රවාහන භාණ්ඩ (බස්රථ,ට්‍රක්රථ)
- ජල සම්පාදන ක්‍රම (ළිං,වැව්,අමුණු)
- වගා කරන ලද ඉඩම් (තේ වතු, රබර් වතු)
- නිෂ්පාදන කාර්යය සඳහා යොදා ගන්නා සතුන් (කිරි ගවයන්)
- බුද්ධිමය දේපළ ආශ්‍රිත වත්කම් (ඛණිජ සම්පත් ගවේශනය) **(ලකුණු 1X4)**

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

III. (අ)
- සම්පත්වල පවත්නා හිඟකම
- හිඟ සම්පත්වල විකල්ප භාවිත පැවතීම
- මිනිස් වුවමනා අසීමිත වීම

(කරුණු තුනම පවතී නම් ලකුණු 02 ක් නැතිනම් ලකුණු 01) **(ලකුණු 02)**

(ආ) නිෂ්පාදනය හෝ පරිභෝජනය පිළිබඳ විකල්ප තේරීම් හමුවේ කිසියම් තේරීමක් සිදු කරන විට ඒ වෙනුවෙන් කැපකරනු ලබන ඊලඟ හොඳම විකල්ප අවස්ථාවේ වටිනාකම ආවස්ථික පිරිවැය ලෙස සැලකේ. **(ලකුණු 01)**
- ආවස්ථික පිරිවැය මූර්ත සංකල්පයකි
- ආවස්ථික පිරිවැය බොහෝදුරට ආත්මගත සංකල්පයකි **(ලකුණු 01)**

IV. (අ)
- තීරණ සම්බන්ධීකරණ යන්ත්‍රණය
- සම්පත් හිමිකාරීත්වයේ ස්වරූපය
- සානුබල වල ස්වභාවය **(ලකුණු 1X2)**

(ආ)
- නවෝත්පාදනය හඳුන්වා දීම දිරිමත් කිරීම
- ආර්ථිකයේ විවිධ අංශ අතර සම්පත් බෙදීයාම, කාර්යක්ෂම කිරීම
- වෙළෙඳපොළ සංඥා සැපයීම
- අවධානම් දැරීම වෙනුවෙන් ප්‍රතිලාභ සැපයීම
- ආයතන ප්‍රසාරණය කිරීම සඳහා සම්පත් සැපයීම
- රජයට බදු අයභාරය සපයන මූලාශ්‍රයක් වීම **(ලකුණු 1X2)**

V. කිසියම් ආර්ථිකයක් විසින් වර්තමාන ප්‍රාග්ධන සම්පාදනය වෙනුවෙන් කැපකරනු ලබන වර්තමාන පරිභෝජනයේ ප්‍රමාණය මත එම ආර්ථිකයේ අනාගත වෘද්ධි සීඝ්‍රතාවය තීරණය කෙරේ.
වර්තමානයේ දී ආර්ථිකයේ සම්පත් සාපේක්ෂව වැඩි ප්‍රමාණයක් ප්‍රාග්ධන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා උපයෝජනය කෙරේ නම් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වී අනාගත විභව නිමවුම විශාල වර්ධනයක් පෙන්නුම් කරනු ඇත. එවිට අනාගත නිෂ්පාදන හැකියාව වර්තමාන නිෂ්පාදන හැකියාවට වඩා විශාල වශයෙන් වැඩි වේ. (විශාල වශයෙන් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වෙයි.)
(ලකුණු 01)



වර්තමාන පරිභෝජනය සඳහා සාපේක්ෂ වශයෙන් අඩු සම්පත් ප්‍රමාණයක් වැය කරන ආර්ථිකයකි.
(ලකුණු 01)

වර්තමානයේ ප්‍රාග්ධන සම්පාදනයට වැඩි සම්පත් ප්‍රමාණයක් වෙන් නොකොට වර්තමාන පරිභෝජනය සඳහා සම්පත් විශාල වශයෙන් යොදාගනු ලැබුවහොත් එම ආර්ථිකයේ අනාගත නිෂ්පාදන හැකියාවේ වර්ධනය ඉතා සීමා සහිත වනු ඇත. අනාගත නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන් වුවහොත් විතැන් වනුයේ මඳ වශයෙනි. **(ලකුණු 01)**



වර්තමාන පරිභෝජනය සඳහා සාපේක්ෂ වශයෙන් විශාල සම්පත් ප්‍රමාණයක් වැය කරන ආර්ථිකයකි.
(ලකුණු 01)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

02. I. අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සලකා බලන සාමාන්‍ය භාණ්ඩයක මිල අඩු වන විට හෙවත් එම භාණ්ඩයේ සාපේක්ෂ මිල පහත වැටෙන විට වෙනත් භාණ්ඩ වල මිලට (උදා.ආදේශන භාණ්ඩ වල මිලට) සාපේක්ෂව අදාළ භාණ්ඩය ලාභදායී වෙයි. එවිට සලකා බලන භාණ්ඩය ආදේශ කිරීමට පාරිභෝගිකයින් කටයුතු කරන නිසා එම භාණ්ඩයේ ඉල්ලුම් ප්‍රමාණය ඉහළ යාම ආදේශන ප්‍රතිවිපාකයේ බලපෑම වෙයි.
(ලකුණු 03)

II. ඉල්ලුම් න්‍යාය මගින් භාණ්ඩයක ඉල්ලුමත් ඉල්ලුමට බලපාන සියලුම සාධකත් අතර විවිධ ආකාරයේ සම්බන්ධතා විග්‍රහ කෙරෙන නිසා එය පුළුල් සංකල්පයක් ලෙස සැලකෙයි.
එහෙත් ඉල්ලුම් නීතිය මගින් අනෙකුත් සාධක ස්ථාවරව තිබිය දී සලකා බලන භාණ්ඩයේ මිලත් ඉල්ලුම් ප්‍රමාණයත් අතර ප්‍රතිලෝම හෙවත් සෘණ සම්බන්ධතාවය පමණක් සලකා බැලෙන නිසා එය පට සංකල්පයක් ලෙස සැලකෙයි. **(ලකුණු 03)**

III. එකඟ නොවේ.
ඉල්ලුම් වක්‍රයේ සෑම ලක්ෂ්‍ය දෙකක් අතර නම්‍යතාවය (චාප නම්‍යතාවය) ඒකීය වන බව සෘජු කෝණාශ්‍රාකාර බහුවලයක හැඩය ගන්නා ඉල්ලුම් වක්‍රයක දැක ගත හැකිය. **(ලකුණු 01)**

මේ හැර ඉල්ලුම් වක්‍රයක සෑම ලක්ෂ්‍යයකම ඉල්ලුම් නම්‍යතාවය නියත අගයක් ගනු ලබන තවත් අවස්ථා දෙකක් පවතී. එනම් පූර්ණ අනම්‍ය ඉල්ලුම් වක්‍රයක ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාවය ශුන්‍ය අගයක් වශයෙන් නියත අගයක් ගනු ලබන අතර පූර්ණ නම්‍ය ඉල්ලුම් වක්‍රයක ඕනෑම ලක්ෂ්‍යයක නම්‍යතාවය අපිරිමිත අගයක් වශයෙන් නියත අගයක් ගනු ලබයි. **(ලකුණු 02)**

IV. (අ)

$$30 - 2p = -6 + 2p$$
$$30 + 6 = 2p + 2p$$
$$36 = 4p$$
$$\frac{36}{4p} = \frac{4p}{4p}$$
$$9 = p$$ (සමතුලිත මිල)

$Qd = 30 - 2p$ හෝ $Qs = -6 + 2p$

$Qd = 30 - 2 \times 9$ $Qs = -6 + 2 \times 9$

$Qd = 30 - 18$ $Qs = -6 + 18$

$Qd = 12$ (සමතුලිත ප්‍රමාණය) $Qs = 12$ (සමතුලිත ප්‍රමාණය)

(සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය ගණනය කිරීමට ලකුණු 01)



(ප්‍රස්ථාර සටහනට ලකුණු 02)

SPEDEVO

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) සමතුලිත මිලේ දී පාරිභෝගික අතිරික්තය $= \frac{(15 - 9) \times 12}{2}$

$= \underline{\underline{36}}$ (ලකුණු 01)

සමතුලිත මිලේ දී නිෂ්පාදන අතිරික්තය $= \frac{(9 - 3) \times 12}{2}$

$= \underline{\underline{36}}$ (ලකුණු 01)

ආර්ථික අතිරික්තය = පාරිභෝගික අතිරික්තය + නිෂ්පාදන අතිරික්තය

= 36 + 36

$= \underline{\underline{72}}$ (ලකුණු 02)

හෝ

ආර්ථික අතිරික්තය $= \frac{(15 - 3) \times 12}{2}$

$= \underline{\underline{72}}$ (ලකුණු 04)

(ඉ) සමතුලිත මිලේ දී ඉල්ලුම් නම්‍යතාව $= \frac{\Delta Q}{\Delta P} \times \frac{P}{Q}$

$= \frac{-2 \times 12}{9}$

$= \underline{\underline{-2.6}}$ (ලකුණු 01)

සමතුලිත මිලේ දී සැපයුම් නම්‍යතාව $= \frac{\Delta Qs}{\Delta P} \times \frac{P}{Qs}$

$= \frac{2 \times 9}{12}$

$= \underline{\underline{1.5}}$ (ලකුණු 01)

(ඊ) මිල රුපියල් 3 දී අධි ඉල්ලුම = ඉල්ලුම් ප්‍රමාණය - සැපයුම් ප්‍රමාණය

= 24 - 0

$= \underline{\underline{24}}$ (ලකුණු 01)

ප්‍රමාණය ඒකක 6 දී අධි
ඉල්ලුම් මිල = ඉල්ලුම් මිල - සැපයුම් මිල

= 12 - 6

$= \underline{\underline{6}}$ (ලකුණු 01)

03. I.



(ලකුණු 01)

CPED DEVO

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(අ) වෙළෙඳපොළ සමතුලිත මිල රුපියල් 40
සමතුලිත ප්‍රමාණය 120 **(ලකුණු 01)**

(ආ) අධි සැපයුම, අවම මිල ප්‍රස්ථාර සටහනේ නිවැරදිව දක්වා ගණනය කළ යුතුයි.
අධි සැපයුම = සැපයුම - ඉල්ලුම
= 160 - 100
= ඒකක 60
අධි සැපයුම මිලට ගැනීමට රජය දරන වියදම = අවම මිල X අධි සැපයුම
= 50 X 60
= රු. 3000 **(ලකුණු 02)**

(ඇ) අධි සැපයුම මිලට ගැනීමෙන් පසු පාරිභෝගික අතිරික්තය $= \frac{(100-50)\times 100}{2} = \frac{50\times 100}{2} =$ රු.2500

අධි සැපයුම මිලට ගැනීමෙන් පසු නිෂ්පාදන අතිරික්තය $= \frac{(50-10)\times 160}{2} = \frac{40\times 160}{2} =$ රු.3200

(ලකුණු 02)

(ඉ) අධි සැපයුම මිලට ගැනීම නිසා අහිමි වූ ශුභසාධනය $= 3000-\frac{(50-40)\times(160-100)}{2}$
= 3000 - 300
= රු.2700
(මෙය විකල්ප ක්‍රම වලින් ද සොයා ගත හැකිය.එවිට ලකුණු ලබා දෙන්න.) (ලකුණු 02)

(ඊ) ඌණ පූර්ණ ගෙවීමේ ක්‍රමය
සහනාධාර සැපයීම
සැපයුම සලාක කිරීම
සාධාරණ තොග ප්‍රතිපත්තිය
භූමිය වගාවට යොදා ගැනීම වෙනුවෙන් ගොවීන්ට ගෙවීමක් කිරීම **(ලකුණු $\frac{1}{2}$ X4=02)**

II. (අ) සාපේක්ෂ වශයෙන් නම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බදු පැනවූ විට පාරිභෝගික බදු බරට වඩා නිෂ්පාදක බදු බර වැඩිවේ. නම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බදු පැනවූ විට රජයේ බදු ආදායම ද සාපේක්ෂව අඩුය. **(ලකුණු 02)**

(ආ) සාපේක්ෂ වශයෙන් අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බදු පැනවූ විට නිෂ්පාදක බදු බරට වඩා පාරිභෝගික බදු බර වැඩිවේ. අනම්‍ය ඉල්ලුමක් සහිත භාණ්ඩයක් මත බදු පැනවූ විට රජයේ බදු ආදායම ද සාපේක්ෂව ඉහළ අගයක් ගනිය. **(ලකුණු 02)**

(ඇ) පූර්ණ අනම්‍ය සැපයුමක් සහිත භාණ්ඩයක් මත බද්දක් පැනවූ විට මුලු බදු බරම නිෂ්පාදකයා විසින් දරනු ලැබේ. **(ලකුණු 02)**

III.
- ආර්ථික අතිරික්තය අඩුවන නිසා සුභසාධනයට අවාසි වීම
- වෙළෙඳපොළ යාන්ත්‍රණය විකෘත්ති වීම
- සහනාධාර වල මූල්‍යම පිරිවැය බදු ගෙවන පුද්ගලයන් මත පතිත වීම
- අකාර්යක්ෂම කර්මාන්ත පවත්වා ගෙන යාමට ලබා දෙන සානුබලයක් වීම
- සහනාධාර ලබා දීමේ දී වංචා දූෂණ ඇති වීම **(එක් කරුණකට 01 බැගින් ලකුණු 04)**

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

04. I. නිෂ්පාදන ආයතනයේ කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමඟ මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට සපුව පහළ යාම හීනවන ආන්තික ඵලදා නීතිය වේ. **(ලකුණු 02)**

උපකල්පනː
- සියලුම විචල්‍ය යෙදවුම් ඒකක සමජාතීය වීම
- අදාල නිෂ්පාදන ක්‍රියාවලිය තුල තාක්ෂණය නොවෙනස්ව පැවතීම **(ලකුණු 01)**

II. a.

ගොඩනැගිලි සඳහා බදු ගෙවීම්	=	16 000
ප්‍රාමාණික ලාභය	=	25 000
ප්‍රාග්ධනය සඳහා පොළී ගෙවීම්	=	20 000
රක්ෂණ වාරික ගෙවීම්	=	19 000
මුළු ස්ථාවර පිරිවැය	=	80 000

සාමාන්‍ය ස්ථාවර පිරිවැය = මුළු ස්ථාවර පිරිවැය / නිමැවුම් ඒකක ගණන

AFC $= \frac{TFC}{Q}$

$= \frac{80\ 000}{200}$

= රු. 400.00 **(ලකුණු 02)**

b.

ඉන්ධන පරිභෝජනය	=	5 000
අමු ද්‍රව්‍ය මිලදී ගැනුම්	=	40 000
සෘජු ශ්‍රම වියදම්	=	15 000
මුළු විචල්‍ය පිරිවැය	=	60 000

සාමාන්‍ය විචල්‍ය පිරිවැය = මුළු විචල්‍ය පිරිවැය / නිමැවුම් ඒකක ගණන

AVC $= \frac{TEC}{Q}$

$= \frac{60\ 000}{200}$

= රු. 300.00 **(ලකුණු 02)**

c. මුළු ලාභය = මුළු අයභාරය - මුළු පිරිවැය

= 150 000 - 140 000

= රු. 10 000

ඒකකයක ලාභය = මුළු ලාභය / නිෂ්පාදන ඒකක ගණන

$= \frac{10\ 000}{200}$

= රු. 50.00 **(ලකුණු 02)**

III. පිරිවැය



නිමවුම

(නිවැරදි රූප සටහනට ලකුණු 01)

SPED DEVO
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ආන්තික පිරිවැය අඩුවන විට ඊට වඩා අඩු වේගයකින් සාමාන්‍ය පිරිවැය අඩුවේ. එසේ වනුයේ මුලු පිරිවැයට එකතු වුණු අවසාන වියදම් ප්‍රමාණය මුලු ඒකක ගණන අතර බෙදී යන නිසාය. ආන්තික පිරිවැය වැඩි වන විට ඊට අඩු වේගයකින් සාමාන්‍ය පිරිවැය වැඩි වේ. මන්ද මුලු පිරිවැයට එකතු වූ අවසාන වියදම් ප්‍රමාණය මුලු ඒකක ගණන අතර බෙදී යන නිසාය.

ආන්තික පිරිවැය සාමාන්‍ය පිරිවැයට සමාන වූ විට සාමාන්‍ය පිරිවැය තවදුරත් ඉහළට හෝ පහළට යනු ඇත. (A ලක්ෂ්‍යයේ දී) ඒ අනුව සාමාන්‍ය පිරිවැය (ATC) වක්‍රයේ අවම ලක්ෂ්‍යය හරහා ආන්තික පිරිවැය (MC) වක්‍රය ගමන් කරයි. **(පැහැදිලි කිරීමට ලකුණු** 02)

IV.

ඒකාධිකාරීතරඟ වෙළෙඳපොළ	කතිපයාධිකාරී වෙළෙඳපොළ
අලෙවිකරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම	කර්මාන්තය තුල තරඟ කරන ආයතන ඉතා සුලු සංඛ්‍යාවක් සිටීම
කර්මාන්තය තුලට පිවිසීමට හා පිටවීමට බාධක නොතිබීම	කර්මාන්තය තුලට අලුත් ආයතන ප්‍රවේශ වීම වලක්වාලීමට ස්වාභාවික හෝ කෘතීම බාධා පැවතීම
මිල දැඩියාවක් දක්නට නොලැබීම (මිලෙහි සුළු වෙනස්කම් පැවතීම)	මිල දැඩියාවක් පැවතීම
ආයතන අතර දැඩි අන්‍යොන්‍ය රැදියාවක් නොපැවතීම	ආයතන අතර දැඩි අන්‍යොන්‍ය රැදියාවක් පැවතීම
ආයතනයක ඉල්ලුම් වක්‍රය වඩා නම්‍ය වූ එකක් වීම	ආයතනයක ඉල්ලුම් වක්‍රය වඩා අනම්‍ය ස්වරූපයක් පැවතීම
සාධක සංචලතාවයට බාධා නොපවතී	සාධක සංචලතාවයට බාධා පවතී
ප්‍රභේදනය වූ භාණ්ඩ නිපදවයි	ප්‍රභේදනය වූ හෝ ප්‍රභේදනය නොවූ භාණ්ඩ නිපදවයි

(වෙනස්කම් 04 කට ලකුණු 04)

V. (අ) නිමැවුම ශූන්‍ය වුවද ස්ථාවර පිරිවැයක් පවතින බැවිනි. නිමැවුම ශූන්‍යඅගයක් ගනු ලැබුව ද ස්ථාවර පිරිවැය අවශ්‍යයෙන්ම ආයතනයකය දැරීමට සිදුවන බැවිනි. **(ලකුණු** 01)

(ආ) ආර්ථික පිරිවැය තුල සෘජු පිරිවැය මෙන්ම වක්‍ර පිරිවැය ද ඇතුලත් වන බැවිනි. **(ලකුණු** 01)

(ඉ) එවැනි අවස්ථාවක දී ප්‍රාමාණික ලාභ උපයාගතත හැකි බැවිනි. විචල්‍ය පිරිවැයට වඩා මුලු අයභාරය වැඩිවන බැවිනි. **(ලකුණු** 01)

(ඊ) සාධක වලට ඇති ඉල්ලුම රඳා පවතින්නේ එම සාධක භාවිතා කොට නිපදවනු ලබන භාණ්ඩ හා සේවාවලට ඇති ඉල්ලුම මත වීමයි. සාධක ඵලදායීතාවයෙන් යුක්ත වීමයි. **(ලකුණු** 01)

05. I. (අ) <u>දළ එකතුකළ අගය</u>

නිමවුමේ දළ වටිනාකමින් අතරමැදි යෙදවුම් / අතරමැදි පරිභෝජනය අඩු කළ විට ශේෂවන අගය දළ එකතු කළ අගය ලෙස හැඳින්වේ.

දළ එකතු කළ අගය = නිමවුමේ දළ වටිනාකම - අතරමැදි පරිභෝජනය / යෙදවුම්

එහි ඇතුලත් වනුයේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා නිෂ්පාදන සාධකවල දායකත්වය වේ. **(ලකුණු** 02)

(ආ) දළ එකතු කළ අගය ගණනය කළහැකි මූලාශ්‍ර දෙකකි.

- නිෂ්පාදන මූලාශ්‍රය
- ආදායම් මූලාශ්‍රය **(ලකුණු** 01)

නිෂ්පාදන මූලාශ්‍රය අනුව එකතු කළ අගය ගණනය කරනුයේ නිමවුමේ දළ වටිනාකමින් පිටතින් ලබාගත් සියළුම යෙදවුම් හෙවත් අතරමැදි යෙදවුම්වල වටිනාකම අඩු කිරීමෙනි.

ආදායම් මූලාශ්‍රය අනුව එකතු කළ අගය ගණනය කරනුයේ නිෂ්පාදන ක්‍රියාවලියට දායක වූ සියළුම නිෂ්පාදන සාධක වලට හෙවත් ප්‍රාථමික යෙදවුම් වලට ලැබෙන ආදායම් සහ සහ ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම් එකතු කිරීමෙනි. **(ලකුණු** 01)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

II. (අ) රු. මිලියන

සේවක ආදායම්	=	5 000	
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	=	12 000	
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම	=	2 000	
මිශ්‍ර ආදායම	=	4 000	
නිෂ්පාදනය මත වෙනත් බදු - එම සහනාධාර	=	3 000	
මූලික මිල යටතේ දළ එකතු කළ අගය	=	26 000	**(ලකුණු 02)**

(ආ) රු.මිලියන

මූලික මිල යටතේ දළ එකතු කළ අගය	=	26 000	
භාණ්ඩ හා සේවා මත බදු - එම සහනාධාර	=	4 000	
දළ දේශීය නිෂ්පාදිතය	=	30 000	**(ලකුණු 01)**
(අඩු කළා) ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජන වියදම	=	2 000	
ශුද්ධ දේශීය නිෂ්පාදිතය	=	28 000	**(ලකුණු 01)**

(ඉ) රු.මිලියන

දළ දේශීය නිෂ්පාදිතය	=	30 000	
(+) අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ ප්‍රාථමික ආදායම	=	-1 000	
(+)අවශේෂ ලෝකයෙන් ලැබෙන ශුද්ධ වර්තන සංක්‍රාම	=	5 000	
වැය කළ හැකි දළ ජාතික ආදායම	=	34 000	**(ලකුණු 02)**

(ඊ) වැය කළ හැකි දළ ජාතික ආදායම - සමාහාර පරිභෝජන වියදම = ජාතික ඉතිරිකිරීම්

34000 - 26000 = 8000 (රු. මිලියන)

(සමීකරණයට ලකුණු 01 , පිළිතුරට ලකුණු 01)

III. කිසියම් ජාතික ආදායම් මට්ටමක් පවත්නා අගයේ සිට ඉහළට හෝ පහළට හෝ වෙනස් වීමට ප්‍රවණතාවයක් නොදක්වන්නේ නම් එම ජාතික ආදායම් මට්ටම සමතුලිත ජාතික ආදායම් මට්ටමක් ලෙස හඳුන්වනු ඇත. **(ලකුණු 01)**

අවශ්‍ය කොන්දේසි,

- ආදායම = වියදම (Y = E)
  Y = C + I + G + (X + M) **(ලකුණු 01)**

- කාන්දුවීම් = විදීම් (W = J)
  S + T + M = I + G + X **(ලකුණු 01)**

- සමාහාර ඉල්ලුම (සමස්ථ) = සමාහාර සැපයුම (සමස්ථ)
  AD = AS **(ලකුණු 01)**

IV. (අ)

Y = E

Y = C + I + G

Y = 180 + 0.8 (Y – 450+225) + 300 + 600 **(ලකුණු 01)**

Y = 1080 + 0.8Y - 180

Y - 0.8Y = 900

Y - 0.2Y = 900

$Y = \frac{9000}{0.2}$

Y = 4 500 **(ලකුණු 01)**

(ආ) සමතුලිත ජාතික ආදායම - බදු + සංක්‍රාම = වැය කළ හැකි කුටුම්බ ආදායම

4500 - 450 + 225 = 4275 **(ලකුණු 01)**

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඉ) S = -180 + 0.2Y

0 = -180 + 0.2 (Y - 450 + 225)

0 = -180 + 0.2 - 450

0.2Y = -225

Y = -225 / -0.2

Y = 1125 (ලකුණු 01)

"ආ" කොටස

06. I. අධි බලැති මුදල්

කිසියම් රටක සමස්ත මුදල් සැපයුම් පදනම ලෙස සැලකෙන මූල්‍ය වත්කම් අධි බලැති මුදල් ලෙස හඳුන්වනු ලැබේ. මේවා සංචිත මුදල් සහ පදනම් මුදල් වශයෙන් හඳුන්වනු ලැබේ. රටක මුදල් සැපයුම් අධි බලැති මුදල් මෙන් කිහිප ගුණයකි. (ලකුණු 01)

කිසියම් රටක අධි බලැති මුදල් තොගය සමන්විත වනුයේ,

- මහජන සහා වානිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය
- වානිජ බැංකු සතුව මහා බැංකුව් ඇති තැන්පතු මුදල් ප්‍රමාණයෙන්
- මහා බැංකුව වෙතැති රජයේ නියෝජිත ආයතන තැන්පතු (ලකුණු 01)

II. **M_2b සංරචක**

- මහජනතාව සතු ව්‍යවහාර මුදල්, මහජනයා සතු ඉල්ලුම් තැන්පතු
- මහජනතාව සතු වාණිජ බැංකුවල ඇති කාලී හා ඉතුරුම් තැන්පතු
- අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම්වල ඇති මහජනතාව සතු කාලීන හා ඉතුරුම් තැන්පතු 50%
- විදේශ ව්‍යවහාර මුදල් බැංකුවල ඇති නේවාසික සතු තැන්පතු (ලකුණු 04)

III. (අ) බැංකු පද්ධතියේ අධි සංචිත

අවශ්‍ය කරන සංචිත = තැන්පතු X ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව

= 15 000 X $\frac{20}{100}$

= 3000

අධි සංචිතය = පවතින සංචිත - අවශ්‍ය කරන සංචිතය

= 5000 - 3000

= රු.මි. 2000 (ලකුණු 02)

(ආ) අධි සංචිත ඇසුරින් මැවිය හැකි ණය ප්‍රමාණය

අධි සංචිතය X තැන්පත් ප්‍රසාරණ සංගුණකය

2000 X 5 = රු.මි. 10 000

බැංකු පද්ධතිය ලබා දී ඇති මුළු ණය = පැවති ණය + නව ණය

= 10 000 + 10 000

= රු.මි. 20 000 (ලකුණු 02)

(ඉ) බැංකු පද්ධතියේ ශේෂ පත්‍රය

වගකීම්		වත්කම්	
තැන්පත්	15 000	සංචිත	5 000
නව තැන්පත්	10 000	ණය	10 000
		නව ණය	10 000
	25 000		25 000

(ලකුණු 02)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ඊ) M_1 මුදල් සැපයුම = බැංකු පද්ධතියේ මුළු තැන්පතු + මහජනයා අතැති ව්‍යවහාර මුදල්
= 25 000 + 5 000
= රු.මි. 30 000 **(ලකුණු 02)**

IV. මධ්‍යකාලීන / මැදි කාලීන වශයෙන් මිල ස්ථායීතාවය ලඟා කර ගන්නා අතරතුර ආර්ථිකයෙහි මූර්ත අංශයෙහි ස්ථායීතාවය හා විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවය පවත්වා ගෙන යනු ලබන ක්‍රමවේදයක් මෙයින් අදහස් කරයි. 2020 වර්ෂය සිට දැඩි උද්ධමන ඉලක්කකරණය වෙනුවට ශ්‍රී ලංකා මහ බැංකුව මෙම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණයට යොමු වේ. **(ලකුණු 03)**

V. සමාහාර සැපයුම් වක්‍රය වමට විතැන්වීම තුළින් (සමාහාර සැපයුම අඩුවීම තුළින්) ඇති වන මිල ඉහළ යාමයි. මෙහි දී යෙදවුම් වල මිල ගණන් ඉහළ යාම නිසා නිෂ්පාදන පිරිවැය වැඩි වීමෙන් භාණ්ඩ හා සේවා වල මිල ඉහළ යයි. මෙයට හේතු නම්, සැපයුම් කම්පන හේතුවෙන් අමුද්‍රව්‍ය මිල හෝ බලශක්ති මිල ඉහළ යාම වැටුප් ඉහළ යාම , කතිපයාධිකාරී වෙළෙඳපොළ තුළ බල පරාක්‍රමය මගින් මිල ඉහළ යාම, භාණ්ඩ වලට බදු පැනවීම, සහනාධාර ඉවත් කිරීම **(එක් කරුණකට 01 බැගින් ලකුණු 03 යි)**

07. I. 1. සම්පත් බෙදීයාම අකාර්යක්ෂම වීම
- පොදු භාණ්ඩ නොසැපයීම
- අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්තව නොසැපයීම
- සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම
- පොදු සම්පත් භාවිතය
- බාහිරතා සැලකිල්ලට නොගැනීම
- අපූර්ණ තරඟය හා ඒකාධිකාරීත්වය
- අපූර්ණ තොරතුරු

2. ආදායම් බෙදීයාමේ විශමතාව / සම්පත් බෙදීයාම අසාධාරණ වීම
3. සාර්ව ආර්ථික අස්ථාපිතාව
- ව්‍යාපාර චක්‍ර
- මිල උද්ධමනය
- විරැකියාව

(ඕනෑම කරුණු 04 කට ලකුණු 04)

II. (අ)

පෞද්ගලික භාණ්ඩ	පොදු භාණ්ඩ
1.ගෙවීමක් කරනු ලබන පුද්ගලයන්ට පමණක් අදාළ භාණ්ඩයේ පරිභෝජනය සීමා කළ හැකි වීම.	1.ගෙවීමක් නොකරන පුද්ගලයන් අදාළ භාණ්ඩය පරිභෝජනය කිරීමෙන් වැළැක්විය නොහැකි වීම/සීමා කල නොහැකි වීම
2.පරිභෝජනය තරඟකාරී වීම	2.පරිභෝජනය තරඟකාරීත්වයක් නොතිබීම

(ලකුණු 02)

(ආ)

ශුභසාධන භාණ්ඩ	අවගුණ භාණ්ඩ
1.මෙම භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් ඉතා විශාල වශයෙන් බාහිර ප්‍රතිලාභ / ධන බාහිරතා හටගනියි.	1.මෙම භාණ්ඩ පරිභෝජනය කිරීමෙන් ඉතා විශාල වශයෙන් බාහිර පිරිවැය/ සෘණ බාහිරතා හටගනියි.
2.පරිභෝජනය / නිෂ්පාදනය සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා අඩුවෙන් සිදුවේ.	2.පරිභෝජනය / නිෂ්පාදනය සමාජීය වශයෙන් ප්‍රශස්ත මට්ටමට වඩා වැඩියෙන් සිදුවේ.

(ලකුණු 02)

III. මෙය පරිභෝජනයේ ධන බාහිරතා හටගන්නා තත්ත්වයකි. එහි දී ආන්තික සමාජීය ප්‍රතිලාභ (MBs) , ආන්තික පෞද්ගලික ප්‍රතිලාභ (MBp) අභිභවා යයි. එවිට නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයක් මගින් ලබා දෙනු ලබන සමතුලිත පරිභෝජන මට්ටම සමාජයීය වශයෙන් ප්‍රශස්ථ පරිභෝජන මට්ටමට වඩා අඩු වේ. **(ලකුණු 01)**

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

පහත සඳහන් රූප සටහන මගින් පරිභෝජනයේ ධන බාහිරතාවන් ඉදිරිපත් කරයි.



(ලකුණු 02)

ඉහත ප්‍රස්ථාරයට අනුව සමාජයීය වශයෙන් ප්‍රශස්ථ පරිභෝජන මට්ටම වන වෙළෙඳපොළ මගින් සපයනු ලබන පරිභෝජන මට්ටම අභිබවා යයි. එබැවින් පරිභෝජනයේ ධන බාහිරතාවන් පවත්වා විට සමාජයට අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා අඩු / ඌණ පරිභෝජනයක් දක්නට ලැබේ. මේ නිසා සමාජයීය වශයෙන් ප්‍රශස්ථ ලෙස සම්පත් උපයෝජනයක් සිදු නොකරයි. **(ලකුණු 01)**

IV. වෙළෙඳපොළ අසාර්ථකවීම මැඩ පවත්වා ගැනීම සඳහා රජය විසින් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමයට කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට ආවේණිකව ඇතැම් දුර්වලතා කරණ කොට ගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී ආර්ථිකයේ තව තවත් අකාර්යක්ෂමතා බිහිකිරීම ආණ්ඩුවේ අසමත් වීමයි. **(ලකුණු 01)**

බලපාන හේතු,

- ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වයේ දක්නට ලැබෙන දෘඩතාවන්
- දේශපාලන ස්වාර්ථය
- ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල අවිදුර දෘෂ්ටිකත්වය
- අපූර්ණ තොරතුරු මත ප්‍රතිපත්ති කරා එළඹීම
- සානුබල කෙරෙහි අහිතකර ලෙස බලපෑම
- ආණ්ඩුවේ මැදිහත්වීම් වලින් වැලකී සිටීමට කටයුතු කිරීම
- පරිපාලන වියදම් ඉහළ යාම **(කරුණු 03ට ලකුණු 03)**
- නිළධාරීවාදය

V.
- ශ්‍රී ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව
- ශ්‍රී ලංකා ගුවන් සමාගම
- විදුලි බල මණ්ඩලය
- දුම්රිය දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව
- රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
- රාජ්‍ය දැව සංස්ථාව
- රාජ්‍ය වතු සංස්ථාව
- රූපවාහිනී සංස්ථාව **(ඕනෑම ආයතන 04 කට $\frac{1}{2}$ බැගින් ලකුණු 02)**

කළමනාරණය දුර්වල වීම යටතේ,

- නුසුදුසු පුද්ගලයින් පත් කිරීම
- දූෂණය
- දේශපාලන මැදිහත් වීම්
- අල්ලස් ගැනීම
- පාර්ශකයින්ට හා හිතවතුන්ට කොන්ත්‍රාත් දීම
- පොදු දේපල අවභාවිතය
- බලය අයුතු ලෙස භාවිතය **(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

08. අ) I. කිසියම් රටකට යම් භාණ්ඩයක් හෝ සේවාවක් තවත් රටකට වඩා කාර්යක්ෂමව නිපදවීමට හැකි වීම නිරපේක්ෂ වාසිය වේ. එම කාර්යක්ෂමතාව යම් යෙදවුම් ප්‍රමාණයකින් වැඩි නිමවුමක් හෝ යම් භාණ්ඩයක් අඩු යෙදවුම් පිරිවැයකින් නිපදවීමට හැකි වීමයි. මෙම නිරපේක්ෂ වාසි භාණ්ඩය විශේෂීකරණය කොට අපනයනය කිරීමත් නිරපේක්ෂ අවාසි භාණ්ඩය ආනයනය කිරීමත් මගින් ජාත්‍යන්තර වෙළෙඳමට පදනම සැකසේ. **(ලකුණු 02)**

යම් රටකට යම් භාණ්ඩයක් හෝ සේවාවක් අඩු ආවස්ථික පිරිවැයකින් නිපදවීමට හැකි වීම සාපේක්ෂ වාසිය වේ. මෙසේ සාපේක්ෂ වාසි සහිත භාණ්ඩය විශේෂීකරණය කොට අපනයනය කිරීමත් සාපේක්ෂ අවාසි භාණ්ඩය ආනයනය කිරීමත් මගින් සාපේක්ෂ වාසිය යටතේ ජාත්‍යන්තර වෙළඳමට පදනම සැකසේ. **(ලකුණු 02)**

II. සමස්ත ආර්ථිකයක තරඟකාරීත්ව වාසිය සංකල්පයෙන් අදහස් කරනුයේ යම් රටකට කිසියම් භාණ්ඩයක් / සේවාවක් පාරිභෝගිකයා වෙත සැපයීමේදී සෙසු තරඟකාරී රටකට වඩා වැඩි වටිනාකමක් පාරිභෝගිකයන් වෙත ලබාදීමට හැකි වීමයි.

එම වටිනාකම අනෙක් රටට වඩා අඩු මිලකට ලබා දීම හෝ ඉහළ මිලක් යටතේ වුවත් වැඩි ගුණාත්මක ප්‍රතිලාභයක් ලබා දීමයි. **(ලකුණු 02)**

තරඟකාරීත්ව වාසි මූලාශ්‍ර දෙවර්ගයකි.

(අ) **<u>පිරිවැය වාසි මූලාශ්‍ර</u>**

- ඵලදායීතාව ඉහළ මට්ටමක පැවතීම
- ධාරිතා උපයෝජනය ඉහළ මට්ටමක පැවතීම
- යෙදවුම් අවම පිරිවැයක් සහිතව ලබා ගැනීමට කේවල් කිරීමේ ශක්තිය යොදා ගැනීම
- තාක්ෂණය ඉහළ මට්ටමකින් යොදා ගැනීම
- වඩා කාර්යක්ෂම බෙදාහැරීම් ජාලයන්ට ප්‍රවේශ වීම

(ආ) **<u>ප්‍රභේදනය සඳහා මූලාශ්‍ර</u>**

- නවෝත්පාදන බිහි කිරීම
- ගුණාත්මක වශයෙන් ඉහළ මට්ටමේ නිෂ්පාදන බිහි කිරීම
- බුද්ධිමය දේපල හිමි කර ගැනීම
- ප්‍රචාරණය **(පිරිවැය හා ප්‍රභේදනය සඳහා මූලාශ්‍ර 03කට ලකුණු 03කි.)**

III.

ආබාධ වෙළඳාම යටතේ X භාණ්ඩයේ නිමවුම් වටිනාකම	=	රු. 1500
ආබාධ වෙළඳාම යටතේ ආනයන යෙදවුම් වටිනාකම	=	රු. 500
ආබාධ වෙළඳාම යටතේ එකතු කළ අගය	=	රු. 1000
තීරු බදු යටතේ X භාණ්ඩයෙහි මිල	=	රු. 1650
ආනයන යෙදවුම් වලට තීරු බදු යටතේ මිල	=	රු. 525
භාණ්ඩ දෙකටම තීරු බදු යටතේ එකතු කළ මිල	=	රු. 1125

$$\text{සඵල ආරක්ෂණ අනුපාතය} = \frac{\left(\text{තීරුබදු යටතේ නිෂ්පාදනයේ එකතු කළ අගය}\right) - \left(\text{අබාධ වෙළෙඳාම යටතේ නිෂ්පාදයේ එකතු කල අගය}\right)}{\text{අබාධ වෙළෙඳාම යටතේ එකතු කල අගය}} \times 100$$

(ලකුණු 01)

$$\text{සඵල ආරක්ෂණ අනුපාතය} = \frac{1125 - 1000}{1000} \times 100$$

$$= 12.5\%$$

(ලකුණු 02)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

ආ) µ) A) වෙළෙඳ ගිණුමේ ශේෂය = භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය
= 2400 - 3600
= 1200

(ලකුණු 01)

B) සේවා ගිණුමේ ශේෂය = රක්ෂණ (ශුද්ධ) + සංචාරක (ශුද්ධ) + ප්‍රවාහන (ශුද්ධ) + මූල්‍ය සේවා(ශුද්ධ)
= (60 - 40) + (120 - 20) + (280 - 240) + (50 - 30)
= 20 + 100 + 40 + 20
= 180 **(ලකුණු 01)**

C) ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = ශුද්ධ පොළී හා ලාභ + සේවක වැටුප් (ශුද්ධ)
= (10 - 50) + (14 - 24)
= - 40 + (10)
= - 50 **(ලකුණු 01)**

D) ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය = සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ (ශුද්ධ)
= 600 - 160
= 440 **(ලකුණු 01)**

µµ) නිල විදේශ සංචිත වත්කම් ලෙස සලකනු ලබන්නේ ජාත්‍යන්තර ගෙවීම් මාධ්‍යයක් ලෙස යොදා ගත හැකි මූල්‍ය වත්කම් ය. ඒවා මහ බැංකුව සහ රාජය සතු විදේශ වත්කම් වලින් සමන්විත වේ. **(ලකුණු 02)**

හෝ

එයට ඇතුළත් වන්නේ, මූල්‍ය රන්, විදේශ විනිමය, SDR, IMF, සංචිත තත්ත්වය, විදේශ ව්‍යවහාර මුදල් ණය, විදේශ ව්‍යවහාර මුදලින් නිකුත් කළ සුරකුම්පත් **(එක් කරුණකට 01 බැගින් ලකුණු 02)**

ඒවා අඩු වීමේ ප්‍රතිවිපාක ,

- සමපේක්ෂණ කටයුතු නිසා විනිමය අනුපාතිකය තව දුරටත් ක්ෂය වීම.
- ණය ශ්‍රේණිගත කිරීම් වල පහත වැටීමක් සිදු වීම
- විදේශ ණය ලබා ගැනීමේ දී විවිධ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වීම හා විශාල වශයෙන් ණය ලබා ගැනීමට සිදු වීම
- ආනයනය සීමා කිරීමට යොමු වීම
- පාලනය කල නොහැකි ලෙස විනිමය අනුපාතය ක්ෂය වීම
- අපනයනකරුවන් රට තුලට මුදල් ගෙන ඒමට පමා කිරීමෙන් මූල්‍ය අර්බුදයක් නිර්මාණය වීම
- නිල විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාවය අඩු වීම
- IMF වලින් සහන ලබා ගැනීමට යොමු වීමෙන් විවිධ කොන්දේසි වලට ලක් වීමට සිදු විය හැකි වීම **(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

09. I. ආර්ථික වෘද්ධිය යනු රටක නිෂ්පාදන ධාරිතාවය හෙවත් විභව නිමවුම ඉහළයාමක් වන අතර කාලයක් තිස්සේ මූර්ත ජාතික නිෂ්පාදනයේ සහ ආදායමේ සිදුවන අඛණ්ඩ වැඩි වීමක් මඟින් එය හඳුනා ගත හැකිය. **(ලකුණු 02)**

- සම්පත් සම්භාරය ඉහළ යාම. (භෞතික ප්‍රාග්ධනය, මානව ප්‍රාග්ධනය, ස්වාභාවික ප්‍රාග්ධනය සහ සමාජ ප්‍රාග්ධනය ඉහළ යාම)
- ඵලදායීතාවය ඉහළ යාම. (තාක්ෂණික දියුණුව, නව්‍යතාවන් බිහි වීම, පර්යේෂණ සහ සංවර්ධනය සඳහා කරන ආයෝජන ඉහළ යාම, කළමනාකරණය උසස් වීම)
- ආර්ථික ස්ථායීතාවය (මූලික සාර්ව ආර්ථික කොන්දේසි ඉහළ තත්ත්වයක පැවතීම)
- ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය වීම.
- අබාධ වෙළෙඳාම සහ ආයෝජන

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- සානුබල පැවතීම
- දේශපාලන සහ සමාජීය ස්ථාවරත්වය
- යහපාලනය තහවුරු වීම **(එක් කරුණකට ලකුණු 0.5 බැගින් ඕනෑම කරුණු 04 කට ලකුණු 02)**

II. ජනගහනය වියපත් වීම නිසා ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන අභියෝග,
- වැඩිහිටියන්ට උපකාර කිරීම සහ රැක බලා ගැනීම තව දුරටත් ගැටළුකාරී වීම.
- විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය වියදම් ඉහළ යාම නිසා රජයේ අයවැය මත අනිවාර්යයෙන් ම පීඩනයක් ඇති වන අතර එම තත්ත්වයන් හේතුවෙන් වෙනත් අංශමත අහිතකර බලපෑම් ඇති වීම.
- වැඩකරන වයසේ පුද්ගලයන්ට සාපේක්ෂව වියපත් පුද්ගලයෙකු විසින් කරනු ලබන ඉතුරුම් ප්‍රවාහය අඩු බැවින් එය ආර්ථිකයේ ප්‍රාග්ධන සම්පාදනය මත සැලකිය යුතු නිශේධනාත්මක බලපෑමක් ඇති කරයි.
- වියපත් වීම හේතුවෙන් වැඩකරන වයසේ පසුවන ජනගහනයේ ප්‍රතිශතය අඩු වීම ආර්ථික වර්ධනය අඩාල කරමින් ශ්‍රම බලකාය හීන කිරීමට හේතුවිය හැකිය.
- ජනගහනය වියපත් වීම ශ්‍රම හිඟය සඳහා යම් දායකත්වයක් සපයනු ලබන අතර මෙම හිඟය ඉදිරි දශක කිහිපය තුල දී වඩාත් හොඳින් දැකගත හැකි වනු ඇත.
- ශ්‍රී ලංකාවේ වියපත් ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යාමක් පවතී. වියපත් ස්ත්‍රී ජනගහනයෙන් වැඩි කොටසක් එම කාණ්ඩයේ පුරුෂයන්ට සාපේක්ෂව ආර්ථිකමය වශයෙන් සක්‍රීය නොවේ. මේ නිසා ස්ත්‍රී යැපෙන්නන් ඉලක්ක කරගත් ඉදිරිගාමී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතා වේ. **(එක් කරුණකට 01 බැගින් ලකුණු 02)**

අභියෝගයන්ට මුහුණ දීමට ඉදිරිපත් කල හැකි යෝජනා,
- වැඩ කරන අවුරුදු ගණන වැඩි කිරීම හා විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණය දියත් කිරීම.
- සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කිරීම
- සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබා දීම
- ශ්‍රම වෙළෙඳපොළෙහි ප්‍රතිසංස්කරණ සිදු කිරීම
- වෙනත් ව්‍යාපාරික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම. **(එක් කරුණකට 01 බැගින් ලකුණු 02)**

III. කුටුම්බ ප්‍රතිශීර්ෂ ජනගහනය නිල දරිද්‍රතා රේඛාවට වඩා පහළ අගයක් ගනු ලබන පුද්ගල සංඛ්‍යාවන්ගේ ප්‍රතිශතය ලෙස ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම මනිනු ලැබේ. **(ලකුණු 01)**

ජනගහන දරිද්‍රතා දර්ශකය හෙවත් දිළිඳු කුටුම්බ ප්‍රතිශතය ගණනය කරනු ලබන්නේ කුටුම්බ ආදායමේ වියදම් සමීකරණයක් විසඳේ. කුටුම්බවල සියළුම ආහාර සසහ ආහාර නොවන පරිභෝජන වියදම් සැලකිල්ලට ගනිමිනි. විවිධ දිස්ත්‍රික්ක අතර තිබිය හැකි ජීවන වියදම් වෙනස්කම් සහ කුටුම්බ තුළ සිටින පුද්ගල සංඛ්‍යාව ද මෙහි දී සැලකිල්ලට ගනියි. **(ලකුණු 01)**

ඉහත ආකාරයට ඇස්තමේන්තු කරනු ලබන කුටුම්බ ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම් ජාතික දරිද්‍රතා රේඛාව නිර්වචනය කරුණු ලැබ ඇත්තේ පුද්ගලයෙකුට දිනකට කැලරි 30 - 40 ක කැලරි අවශ්‍යතාවක් සපුරා ගැනීමට කොතරම් මුදලක් වියදම් කිරීමට සිදුවේ ද යන්න පදනම් කර ගනිමිනි. 2016 ආදායම් වියදම් සමීකරණයේ තොරතුරු මත ඇස්තමේන්තු කරන ලද දරිද්‍රතා රේඛාවේ වටිනාකම රුපියල් 4166 ක් විය. **(ලකුණු 01)**

කුටුම්බයක මාසික මූර්ත ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම නිල දරිද්‍රතා රේඛාවට වඩා අඩු ද යන්න මත දරිද්‍රතාවයට මුහුණ දී සිටින පුද්ගලයන් හඳුනා ගනු ලැබේ. **(ලකුණු 01)**

IV.
- ආර්ථික වෘද්ධිය දරිද්‍රතාවය දුරලීමේ ප්‍රබල මාධ්‍යයක් ලෙස ලොව පුරා පිළිගැනේ.
- වෘද්ධි ක්‍රියාවලිය නිසා සමාජයට ආර්ථික සෞභාග්‍ය සහ ආර්ථික අවස්ථා බිහි කෙරේ. රැකියා අවස්ථා පුළුල් වීමත් ආදායමේ මට්ටම ප්‍රසාරණය වීමත් නිසා තම දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමටත් දෙමව්පියන්ට විශාල හැකියාවක් ලැබේ.
- විවිධ ආර්ථික සමාජීය පරිසරයන් තුළ ආර්ථික වෘද්ධිය දරිද්‍රතාවය මත ඇති කරනු ලබන බලපෑම් වෙනස්විය හැකිය. වෘද්ධිය කොතෙක් දුරට දරිද්‍රතාවය අඩු කිරීමට දායක වන්නේ ද යන්න රඳාපවතිනුයේ වෘද්ධියේ ප්‍රතිලාභ භුක්ති විඳීමට දිළිඳු ජනකොටස් වලට අවස්ථා සැලසේ ද යන්න මතය ඒ නිසා ආර්ථික වෘද්ධි රටාවන් ද වැදගත් වනු ඇත.
- ආර්ථික වෘද්ධියත් සමඟ බොහෝ දුරට ඇති වන තත්ත්වයකි. ආදායම් බෙදී යාමේ විෂමතාවයන් වර්ධනය වීම එවැනි තත්ත්වන් තුළ දිළිඳුකම දුරලීමට ආර්ථික වෘද්ධියේ දී වන බලපෑම සීමාවනු ඇත.
- ආර්ථික වෘද්ධියත් සමඟ දිළිඳුන්ට ප්‍රතිලාභ සැලසෙන ආකාරයේ ඌන පූර්ණ ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවුවහොත් දිළිඳුකම අඩු වීමට ආර්ථික වෘද්ධිය සමත් වනු ඇත.
- ආර්ථික වෘද්ධියත් සමඟ සමාජ ආරක්ෂණ ජාල ක්‍රියාවට නැංවීමෙන් සාර්ථක ප්‍රතිපල ලබා ගත හැකි වේ.
- ආර්ථික වෘද්ධියත් සමඟ අඩු ආදායම් ලබන අයගේ ආදායම් ද ඉහළ යා යුතු අතර ශ්‍රම වෙළෙඳපොළ වඩාත් කාර්යක්ෂම කිරීම , ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙනස්කම් සහ විෂමතාවයන් ඉවත් කිරීම මූල්‍ය පහසුකම් සඳහා අවස්ථා සියල්ලන්ටම විවෘත කිරීම වැදගත්වනු ඇත.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

V. - සාර්ව ආර්ථික ස්ථායීතාවය
- ශ්‍රම වෙළෙඳපොළෙහි පවත්නා කුසලතා හා රැකියා අතර නොගැලපීම ඉවත් කිරීම
- රටක ආර්ථික සහ විදේශ ප්‍රතිපත්ති (රාජ්‍ය ප්‍රතිපත්ති)
- සරල සහ ඵලදායී බදු ක්‍රමයක් පැවතීම
- වෙළෙඳ විවෘතභාවය
- තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයට අනුගත වීම
- නීතිමය ක්‍රියාදාමයන්
- යටිතල පහසුකම් ජාලය
- ඉදිරි දැක්ම **(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04)**

10. I. එක්සත් ජාතීන්ගේ කමිටු නිර්දේශය අනුව ආහාර සුරක්ෂිතතාව යනු, "සෑම පුද්ගලයෙකුටම සෑම විටම ක්‍රියාශීලී සහ සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා ඔවුන්ගේ ආහාර වරණයන් සහ ආහාර අවශ්‍යතා සපුරාලන පරිදි ප්‍රමාණවත් ආරක්ෂිත සහ පෝෂ්‍යදායී ආහාර සඳහා භෞතික , සමාජීය , ආර්ථික ප්‍රවේශයක් පැවතීමයි." **(ලකුණු 03)**

II.
- ගොවීන්ට තිබෙන කාබනික හා රසායනික පොහොර ගැටලුව , පශු අස්වනු හානි
- පලිබෝදකයින්ගේ බලපෑම් (වල්නාශක හා පලිබෝද නාශක භාවිතය සම්බන්ධ ගැටලු
- රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වල නොගැලපීම සහ අවිනිශ්චිතතා (උදා: පොහොර සහනාධාරය පිළිබඳව)
- අඩු ආදායම් සහ අඩු ඵලදායීතාව
- වෙනත් කාර්මික ක්‍රියාකාරකම් හා නාගරීකරණය හේතුවෙන් ඉඩම් සහ ජල සම්පත් වැනි කෘෂිකාර්මික කටයුතු සඳහා පවතින සම්පත් වේගයෙන් අඩු වීම.
- ශ්‍රම සූක්ෂම නිෂ්පාදන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පොදුවේ මුහුණ දෙන්නා වූ ශ්‍රම හිඟය

(එක් කරුණකට එක බැගින් ලකුණු 04)

III. සිව්වන කාර්මික විප්ලවය යනු, "අන්තර්ජාලීය සේවා (Internet of Thinks) රොබෝ විද්‍යාව , අතත්‍ය යතාර්ථය (virtual Reality) , 3G මුද්‍රණය , කෘතීම බුද්ධිය (Artifycial Interligente) , කඩාකප්පල්කාරී තාක්ෂණය වැනි ප්‍රවනතා ඔස්සේ අපගේ ජන ජීවිතය හා වැඩ ලෝකය පිළිබඳ ව වර්තමානයේ සිදුවෙමින් පවත්නා සීඝ්‍ර වෙනස්කම් ය. **(ලකුණු 01)**

ශ්‍රී ලංකාවට මුහුණදීමට තිබෙන අභියෝගන් නම්,

- එදිනෙදා ජීවිතයේ සාමාන්‍ය අංශ බවට පත් වීමට බොහෝ පිරිසකට නොහැකි වීම. (උදා: GPS පද්ධතිය , මුහුණු පොතට මුහුණ දීමේ හැකියාව නොමැති වීම)
- ආර්ථික , සමාජ , සෞඛ්‍ය , අධ්‍යාපනය , ජීවන රටාව , රැකියා වල ස්වභාවය , නිපුණතා සංවර්ධනය වැනි අංශ වලට යොමු වීමේ ප්‍රවණතාව මන්දගාමී වීම.
- නවීන තාක්ෂණය අන්තර්ග්‍රහණය කර ගැනීමට ජාත්‍යන්තර වාතාවරණයන් නිර්මාණය කර ගැනීමට නොහැකි වීම.
- ශ්‍රී ලංකාව තවමත් දෙවෙනි කාර්මික විප්ලවයක් තුළ කල් ගෙවන නිසා පහළ මට්ටමක පරිගණක සාක්ෂරතාවය සහ ඉහළ මට්ටමේ තාක්ෂණය අවශෝෂණය කර ගැනීමට නොහැකි වීම. (ශ්‍රී ලංකා ජනගහණයෙන් පරිගණක සාක්ෂරතාවය 22.9% කින් 2018)
- තාක්ෂණික යටිතල පහසුකම් පිළිබඳ ව ප්‍රාදේශීය වෙනස්කම් නිවැරදි කර ගැනීම.
- අදාල මානව ප්‍රාග්ධනය පිළිඹිබුවන ඉහළ නිපුණතා සහිත කඩිසර සහ බහු මුහුණුවර සහිත ශ්‍රම හමුදාවක් නොමැති වීම.
- විද්‍යාව , තාක්ෂණය , ඉංජිනේරු විද්‍යාව සහ ගණිතය විෂයන් පිළිබඳ පුහුණුවලත් ගුරුවරු පාලස්වල නොසිටීම.
- යල්පැන ගිය තාක්ෂණය භාවිත කොට නිෂ්පාදනය නිමවුම් වල එකතු කල අගය ඉතා අඩු වීම.
- සේවා අංශයේ වර්ධනය වෙළෙඳ නොවන ආර්ථික ක්‍රියාකාරකම් මත වර්ධනය වී ඇති නිසා ඒවා පරිවර්තනයකට යොමු නොවී තිබීම. **(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03)**

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

IV. ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන අභ්‍යන්තර ආර්ථික අභියෝග නම්,

- ජාතික ආදායම පහත වැටීම (ආර්ථික වර්ධන වේගය සෘණ වීම)
- අයවැය හිඟය විශාල වීම (රාජ්‍ය ආදායම විශාල වශයෙන් අඩු වීම)
- බැංකු පද්ධතිය අවධානමකට ලක්ව තිබීම **(ලකුණු 01)**

ශ්‍රී ලංකාව මුහුණ දී තිබෙන බාහිර ආර්ථික අභියෝග නම්,

- ගෙවුම් ශේෂ ප්‍රශ්නය (වෙළඳ ගිණුමේ සහ වර්ථන ගිණුමේ විශාල හිඟය)
- විදේශ විනිමය සංචිත ක්ෂය වීම
- විනිමය අනුපාතිකය කඩා වැටීම
- විශාල වශයෙන් ණය වාරික සහ පොළී ගෙවීම් සිදු කල යුතු වීම
- ණය ශ්‍රේණිගත කිරීම් පහත වැටීම **(ලකුණු 01)**

අභ්‍යන්තර අර්බුද යටතේ අයවැය හිඟය විශාල ලෙස වැඩි වීම කෙරෙහි ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආදායම අඩු වීම බලපා ඇත. මේ සඳහා රජය විසින් ලබා දුන් විශාල බදු සහනයන් හේතු වී ඇත. උදාහරණ ලෙස ,

- පුද්ගල ආදායම් බදු ගෙවීමේ නිදහස් සීමාව ඉහළ දැමීම (වාර්ෂික ආදායම ලක්ෂ 17 - 30 දක්වා)
- වැට් බද්ද 15% සිට 8% දක්වා අඩු කිරීම
- සීනි බද්ද රුපියල් 49 සිට සත 25 දක්වා අඩු කිරීම **(ඕනෑම කරුණකට ලකුණු 01)**

බාහිර අර්බුද වලට ප්‍රධාන වශයෙන් හේතු වී තිබෙන්නේ විදේශ විනිමය සංචිත පහත වැටීමයි. ඒ සඳහා බලපා තිබෙන්නේ විදේශ ණය යි. එම ණය වලින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රතිලාභ ලබා ගත් ණය වාරික හා පොළී ගෙවීමට ප්‍රමාණවත් නැත. කොරෝනා වසංගතය නිසා අපනයන කර්මාන්තය මෙන්ම සංචාරක කර්මාන්තය මඟින් ලැබුණු ආදායම් අඩු වී ඇත. එසේ ම විදේශගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ ද අඩු වනු ඇත. දැනට තිබෙන විදේශ සංචිත ප්‍රමාණය ගෙවීමට ඇති විදේශ ණය සහ පොළීය සඳහා ප්‍රමාණවත් නොමැත. එම නිසා එයට පිලියමක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි වලට යටත් ව හෝ සහන ලබා ගැනීමට සිදුවනු ඇත. **(ලකුණු 01)**

V. දැනුම් ආර්ථිකය තුල තරඟකාරීත්වය පිළිබඳ කරන මෙම දර්ශකය ලෝක බැංකුව විසින් සකසනු ලබන අතර ඒ සඳහා ප්‍රධාන නිර්ණායකයන් 04 ක් පදනම් කර කරයි.

1. ආර්ථික සානුබල සහ ආයතනික ව්‍යුහය
2. නව්‍යතාවයන් හා තාක්ෂණය උපයෝගී කර ගැනීමේ නැඹුරුව
3. අධ්‍යාපනය හා පුහුණුව
4.ICT යටිලත පහසුකම් **(කරුණු 04 ට $\frac{1}{2}$ බැගින් ලකුණු 02)**

ශ්‍රී ලංකාවට දැනුම් ආර්ථිකයක් කරා ලඟා වීමට තිබෙන අභියෝගයන් නම්,

- ආර්ථික වෘද්ධි අනුපාතිකය පහළ මට්ටමක පැවතීම නිසා සමාජයේ අධ්‍යාපන මට්ටම පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මානව ප්‍රාග්ධන සමුච්චිතය පහළ මට්ටමක පැවතීම.
- පර්යේෂණ සහ සංවර්ධනය සඳහා වැයකරන අරමුදල් පහළ මට්ටමක පැවතීම.
- ශ්‍රී ලංකාව තුල පවතින අඩු නිපුණතා සහ අඩු වැටුප් පදනම් කර ගත් කාර්මීකරණ ක්‍රියාවලිය නිසා දැනුම් කේන්ද්‍රීය ආර්ථික වෘද්ධි ක්‍රියාවලිය කරා නැඹුරු වීමේ හැකියාව අඩු වීම.
- 1998 වන විට ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් බවට පත් වීමත් සමග ශ්‍රී ලංකාවට විදේශ වලින් ලැබෙන ප්‍රදානයන් හා ආධාර සීමා වීම නිසා අධ්‍යාපනය , පුහුණුව , පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලට ආයෝජනය කල හැකි මුදල් ප්‍රමාණය අඩු වීම.
- සෘජු විදේශ ආයෝජන අඩු තාක්ෂණය සහිත ශ්‍රම සූක්ෂම කර්මාන්ත වෙත ගලා ඒම නිසා මානව ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීමේ ඉඩ ප්‍රස්ථා අඩු වීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 03)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources